සම්පාදනය කළේ:

COLOMBO SCHOOL OF BUSINESS & MANAGEMENT

IPSA SCIENTIA POTESTAS EST

අනුග්‍රහය:

**ඒකාබද්ධ පොල් සංගමය**

ශ්‍රී ලංකා පොල් වගාකරුවන්ගේ සංගමය

ලංකා දිසිදි පොල් නිෂ්පාදකයින්ගේ සංගමය

පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය

කොහු කර්මාන්ත හිමියන්ගේ සංගමය

පොල් තෙල් කර්මාන්ත හිමියන්ගේ සංගමය

කොහු නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය

නැවුම් පොල් තෙල් අපනයනකරුවන්ගේ සංගමය

ශ්‍රී ලංකාවේ

# පොල් කර්මාන්තයේ

## ඉදිරි ගමන් මඟ සඳහාවන ක්‍රමෝපාය සැළැස්ම

# අන්තර්ගතය


**1. දැක්ම ........................................................................................................................5**

**2. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය** ...............................................................Error! Bookmark not defined.

**3. ශ්‍රී ලංකාවට පොල් කර්මාන්තයේ ඇති වැදගත්කම ...................................................................5**

**4. ශ්‍රී ලංකාවේ පොල් වටිනාකම් දාමය ......................................................................................6**

**5. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට බාධා කරන සාධක ....................................................6**

**6. SWOT විශ්ලේෂණය ...........................................................................................................9**

**7. අරමුණු .........................................................................................................................14**

**8. ඉලක්කයන් සහ උපාය මාර්ග ...............................................................................................14**

1. නිෂ්පාදන හා වෙළඳපල විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කරන්න ................................... 15
2. පවත්නා වගාවන්හී ඵලදායිතාව උපරිම කිරීම.......................................................................18
3. අංශ විවිධාංගීකරණය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන්ට ඵලදායී ලෙස සැලසුම් කිරීමට හැකිවන පරිදි වෙළඳපල, නිෂ්පාදන සහ ව්‍යාපාර ශක්‍යතා තොරතුරුවල ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩි දියුණු කිරීම.................................................................................................................................24
4. රට තුළ පොල් එකතු කිරීම හා සැපයීම වැඩි කිරීම.................................................................26
5. සියළුම පාර්ශවකරුවන් විසින් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මූල්‍ය යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම...........................................................................................28
6. පොල් නිෂ්පාදන අගය එකතු කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා පොල් සැකසුම් කර්මාන්තයක් සංවර්ධනය කිරීම....................................................................................... 29
7. ක්ෂේත්‍රයේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා උපකාරක සේවා වැඩිදියුණු කිරීම............31
8. පොල් අංශය කළමනාකරණය කිරීම සඳහා සුදුසු පරිපාලන හා නියාමන රාමු ඇති කිරීම සඳහා පොල් කර්මාන්තය දියුණු කිරීමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ මණ්ඩලයක් පිහිටුවීම............................................................................................................33

9. **පොල් සංවර්ධන උපාය මාර්ගයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බලපාන සාධක..........................................39**

10. **නිගමනය...........................................................................................................................40**

# විධායක සාරාංශය

ශ්‍රී ලංකා පොල් වගාකරුවන්ගේ සංගමය, ලංකා දිසිදි පොල් නිෂ්පාදකයින්ගේ සංගමය, පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය, කොහු කර්මාන්ත හිමියන්ගේ සංගමය, පොල් තෙල් කර්මාන්ත හිමියන්ගේ සංගමය, කොහු නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය, නැවුම් පොල්තෙල් අපනයනකරුවන්ගේ සංගමය යන සංවිධාන 7 කින් සමන්විත ඒකාබද්ධ පොල් කර්මාන්ත කරුවන්ගේ සංගමයේ ආරාධනයෙන් කොළඹ ව්‍යාපාර හා කළමනාකරණ පාසල විසින් "ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා ඉදිරි උපාය මාර්ග" යෝජනා ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලදී.

මෙහිදී කොළඹ ව්‍යාපාර සහ කළමනාකරණ පාසල විසින් සමස්ත කර්මාන්තය ආවරණය වන ආකාරයට, ව්‍යුහගත සහ මධ්‍යස්ථ නාභිගත කණ්ඩායම් සාකච්ඡා මාස 5-6 ක කාලයක් පුරාවට පවත්වන ලදී. මෙම ක්‍රියාවලියේදී කර්මාන්තයට අයත් සියලුම පාර්ශව කරුවන් සන්බන්ධ කර ගන්නා ලද අතර ඒ තුලට කර්මාන්තය කෙරෙහි ඍජු සහ වක්‍ර ලෙස බලපෑම් ඇතිකරන කර්මාන්තකරුවන් සහ ආයතන, අමාත්‍යංශ සහ අමාත්‍යංශ සංවිධාන සහ ක්ෂේත්‍ර විශේෂඥයන් සහ තීරකයන් 120 දෙනෙක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා ඉදිරි ක්‍රමෝපායන් සකස් කිරීමේදී මෙම තොරතුරු, ගැටළු, අවහිරතා සහ නිර්දේශයන් සම්පාදනය කර විශ්ලේෂණය කරන ලදී. මෙම ලේඛනයේ සුවිශේෂත්වය නම්, යෝජිත වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් කර්මාන්තය විසින් ම කර්මාන්තයේ උන්නතිය උදෙසා මෙම වාර්තාවේ සඳහන් සැලසුම් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබීමයි.

ඉදිරි ක්‍රමෝපාය සැලැස්ම කර්මාන්තය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයකින් සරල ආකාරයකින් ඉදිරිපත් කර ඇති අතර, ළඟා කර ගත යුතු උපායමාර්ගික අරමුණු 8 කින් ජයග්‍රහණ ළඟා කර ගත හැකි ආකාරයට මෙම සැළැස්ම සකස් කොට ඇත. මෙම අරමුණු කර්මාන්තය සඳහා උපායමාර්ගික අවධානය යොමු කළ යුතු අංශ 8 ක් නියෝජනය කරන අතර, ඒවාට ඇතුළත් වන්නේ,

1. නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කිරීම
2. පවත්නා වගාවන්හි උපරිම ඵලදායිතාව ලබාගැනීම
3. අංශ විවිධාංගීකරණය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන්ට ඵලදායී ලෙස සැලසුම් කිරීමට හැකිවන පරිදි වෙළඳපල, නිෂ්පාදන සහ ව්‍යාපාර ශක්‍යතා තොරතුරුවල ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩි දියුණු කිරීම.
4. රට තුළ පොල් එකතු කිරීම හා සැපයීම වැඩි කිරීම
5. සියළුම පාර්ශවකරුවන් විසින් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මූල්‍ය යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම
6. පොල් නිෂ්පාදන අගය එකතු කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා පොල් සැකසුම් කර්මාන්තයක් සංවර්ධනය කිරීම
7. ක්ෂේත්‍රයේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා උපකාරක සේවා වැඩිදියුණු කිරීම
8. පොල් අංශය කළමනාකරණය කිරීම සඳහා සුදුසු පරිපාලන හා නියාමන රාමු ඇති කිරීම සඳහා පොල් කර්මාන්තය දියුණු කිරීමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ මණ්ඩලයක් පිහිටුවීම.

මෙම සෑම ඉලක්කයක්ම ක්‍රමෝපායන්, සවිස්තරාත්මක ක්‍රියාමාර්ගයන් හා මිනුම් හා නිර්නායකයන් සමඟ බෙදා වෙන්කොට ඉලක්ක ක්‍රියාත්මක කිරීම හා සාක්ෂාත් කරගැනීම සහතික කරනු ලැබේ. සමස්තයක් වශයෙන් එවැනි ක්‍රියාකාරී කරුණු 78 සහ ක්‍රියාකාරකම් මෙම ලේඛනය ඔස්සේ යෝජනා කෙරේ.

කර්මාන්තයේ සහ රජයේ අංශ සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත. එබැවින් ශක්‍යතාවය, එකඟතාවය සහ සහභාගීත්වය පූර්ණ ලෙස සහතික කෙරේ.

උපායමාර්ගික රාමුවේ ප්‍රධාන විශේෂත්වය වනුයේ ඒකාබද්ධ පොල් කර්මාන්ත වාණිජ මණ්ඩලයක් පිහිටුවීම යි. එය රාජ්‍ය උපදේශනය සහ සහයෝගය සහිතව පොල්කර්මාන්තයෙහි නිරත ආයතනයන් සඳහා පහසුකම් සපයන එකාබද්ධ කර්මාන්ත ලේඛම් කාර්යාලයක් ලෙස පවත්වාගෙන යාමට අපේක්ෂා කරයි.

ඉහත අරමුණු, උපායමාර්ගික අවධානය යොමු කළ යුතු අංශ සහ ක්‍රියාකාරී කරුණු කර්මාන්තයේ සමස්ත දැක්මක් ඉලක්ක කර ගෙන ඇත. එනම් ''ශ්‍රී ලාංකික ජනතාවගේ ජාතික ආදායම, සමගිය සහ ආර්ථික සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයන නවීකරණය කරන ලද පොල් කර්මාන්තයක් සංවර්ධනය කිරීම යි", පොල් කර්මාන්තය දියුණු කිරීමේ දැක්ම සාත්ෂාත් කර ගැනීමේ දී උපායමාර්ගීක රාමුව තුල 2020-2025 දක්වා වසර පහක කාලයක් සඳහා යෝජනා ඉදිරිපත් කෙරේ. මෙම කාලසීමාව තුළ කර්මාන්තය විසින් සැලසුම් කර ඇති ක්‍රියාකාරී කරුණු 78 ක් අමාත්‍යාංශයේ සහ යෝජිත පොල් කර්මන්ත වාණිජ මණ්ඩලයෙහි නායකත්වය යටතේ සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර තිබේ. මෙමඟින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා ඉදිරි මඟ සහතික කෙරේ.

## 01. දැක්ම

*ශ්‍රී ලාංකීය ජාතික ආදායමේ සැලකිය යුතු වර්ධනයක් මෙන්ම ජාතික සමගිය, එකමුතුබව, සමෘද්ධිය, සහ ආර්ථික සංවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් සලසන නවීකරණය කරන ලද පොල් කර්මාන්තයක් ගොඩනැගීම*

## 02. *ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය*

මේවන විට ශ්‍රී ලංකාවේ අක්කර මිලියන 1.1 කට වඩා අධික භූමි ප්‍රමාණයක පොල් වගාව ව්‍යාප්ත වී තිබේ. මෙයින් 20 %ක ප්‍රමාණයක් අක්කර 2.5 කට වඩා වැඩි භූමි තුළ සිදුකෙරෙන, එනම් මහා පරිමාණ පොල් වතු වගාවන් වන අතර, ඉතිරි 80%, අක්කර 2.5ට වඩා අඩු භූමි ප්‍රමාණයක් තුළ, එනම් කුඩාවතු හිමියන් සහ නිවෙස් ආශ්‍රිත භූමින්හී ව්‍යාප්තව ඇත. මෙම කුඩාවතු සහ නිවෙස් ආශ්‍රිත පොල් වගාව කරගෙන යන්නා වූ පවුල් සංඛ්‍යාව 700,000 කට වඩා වැඩි ප්‍රමාණයක් බව ඇස්තමේන්තු කර තිබේ. සාමාන්‍යයෙන් වාර්ෂිකව මිලියන 2800 - 3000 ක පමණ පොල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කෙරේ. වසරකට අපේ සාමාන්‍ය ගසකින් ලැබෙන අස්වැන්න පොල් ගෙඩි 50 ට වඩා අඩු වන අතර, එය කලාපයේ අනෙකුත් පොල් වගා කරන රටවලට සාපේක්ෂව ඉතා අඩු අගයකි.

ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයෙකුගේ වාර්ෂික පොල් පරිභෝජනය පොල් ගෙඩි 110කි. මාසික ගෘහස්ත පොල් පරිභෝජන අවශ්‍යතාවය මිලියන 150ක් සහ කර්මාන්ත/ව්‍යාපාර පරිභෝජනය සඳහා මිලියන 100ක් අවශ්‍ය වේ. මිලියන 1800ක වාර්ෂික පොල් පරිභෝජන ඉල්ලුමක් ඇති අතර, එයින් මිලියන 1200ක ප්‍රමාණයක් කර්මාන්තයෙන් නිස්පාදනය කෙරේ.

පොල් කර්මාන්තය උප අංශ 2 කින් සමන්විත වේ. එනම්:

**මදය ආශ්‍රිත (kernel) සහ මදය ආශ්‍රිත නොවන (non-kernel) නිෂ්පාදන**

- මදය ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදනයන්
  පොල්තෙල්, පිරිපහදු කරන ලද/ වර්ජින් පොල්තෙල්, දිසිදි පොල්, කොප්පරා, නැවුම් පොල් ගෙඩි, තැඹිලි, පුන්නක්කු, තෙල් කේක්, පොල් ක්‍රීම්, පොල් කිරි, පොල් කිරිපිටි, තෙල්/මේදය ඉවත් කරනලද පොල්,පොල් වතුර, පොල් වලින් සාදන ලද අරක්කු, විනාකිරි, පොල් මේද අම්ලය, පොල් බටර්, පොල් පිටි


- මදය ආශ්‍රිත නොවන නිෂ්පාදනයන්
  පොල්කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, කොහු මෙට්ට, බ්‍රිස්ටල් ෆයිබර්, ඇඹරු තන්තු
  පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන
  පොල් කටු අඟුරු, පොල් කටු කැබලි සහ කටු පිටි, පොල් කටු ආශ්‍රිත සක්‍රීය කාබන්
  නිමි නිෂ්පාදනයන් (තන්තු/කෙඳි)
  කොහු නූල්, කොහු ලණු, කොහු බුරුසු, කොහු කොසු සහ බුරුසු, (තවාෂි බුරුසු හැරුණු විට), රබර් පදම් කළ කොහු පෑඩ් සහ ඇඳ මෙට්ට, කොහු ආවරණ සහ පාපිසි (එම් 2), 1කොහු මැටිං (එම් 2), කොහු කෙඳි තාර/ දූවිලි, ලෙලි චිප්ස්, හු රෙදිපිළි
  උද්‍යාන සඳහා අච්චු සහිත කොහු නිෂ්පාදන
  වෙනත් නිෂ්පාදනයන්
  පොල් එකල්ස්, පොල් ලී

වර්තමානයේදී පොල් නිෂ්පාදන ආශ්‍රිතව ඇමරිකානු ඩොලර් මිලියන 600ක අදායමක් ලබන අතර එයින් 55% මදය ආශ්‍රිත නිෂ්පාදන හා 45% මදය නොවන නිෂ්පාදන යටතේ ලබා ගැනේ.

## 03. ලංකාවට පොල් කර්මාන්තයේ ඇති වැදගත්කම

- පොල් කර්මාන්තය අපට වටිනා විදේශ විනිමය ලබා දෙයි
- ජනතාවගේ ජීවනෝපාය සඳහා අත්‍යාවශ්‍ය නිෂ්පාදන වලින් එකකි
- රැකියා අවස්ථා රැසක් ලබාදෙයි
- විවිධ කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම
- රටේ ආර්ථිකය නගා සිටුවීමට උපකාරී වේ
- මෙය දේශීය සංස්කෘතිය හා සමාජය සමඟ බැඳී ඇති කර්මාන්තය කි
- ශ්‍රී ලංකාවේ දෙවන වැදගත්ම ආහාරය "දෙවැනි බත"
- වනාන්තර ආවරණය අහිමි ප්‍රදේශ සඳහා පොල් වගාව හොඳ විකල්පය කි

## 04. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ වටිනාකම් දාමය




## 05. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට බාධා කරන සාධක

වටිනාකම් දාමය හරහා ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට ඍණාත්මක බලපෑම් ඇති කරනා වු ප්‍රධාන බාධක අංශ හතරක් ඇත.

1. වගාකරුවන් මුහුණපාන බාධක
2. සැපයුම්කරුවන් සහ වෙනත් අතරමැදියන් මුහුණ පාන බාධක
3. පොල් සැකසුම්කරුවන්ගේ බාධක
4. අපනයනකරුවන් හා අපනයන ආයතන මුහුණ පාන බාධක

## 1. වගාකරුවන් මුහුණපාන බාධක

පොල් වගාව/ කර්මාන්තය ව්‍යාප්ත කිරීම සඳහා වගාකරුවන්ගේ උනන්දුව අඩුවීම සහ නව වගාකරුවන්/ ආයෝජකයින් කර්මාන්තයට පිවිසීම සඳහා වන අභිප්‍රේරණයන් අවම වීම. මේ සඳහා විවිධ හේතු තිබේ.

- සැකසීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ප්‍රමාණවත්, තත්ත්වයේ උසස් රෝපණ ද්‍රව්‍ය අවම විම.
- ගෘහස්ථ අමුද්‍රව්‍ය එකතු කිරීමේ නිසි යාන්ත්‍රණයක් නොමැතිකම.
- උපකරණ ලබා ගැනීමට නොහැකි වීම හා පිටපලාත්වල නිෂ්පාදකයින්ට යන්ත්‍රපකරණ ලබාගැනීමට ඇති පහසුකම් අවමවීම
- වගාකරුවන් බොහෝමයක්, විශේෂයෙන් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ගොවියන් දුර්වල වැවිලි කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම සහ පොල් ඉඩම් කළමනාකරණය පිළිබඳව වාණිජමය ප්‍රවේශයක් ඔවුන් හට නොමැති කම
- නවීන තාක්ෂණයන්, නවීකරණය හා පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ආයෝජනය කරන්නන් අවම වීම. එබැවින් කර්මාන්තයේ තාක්ෂණික දියුණුවේ හිඟකම
- වාරිමාර්ග හා ජල පද්ධති ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නොමැති අතර පැල තවාන් කෙරෙහි අවධානය අවම මට්ටමක පවතී.
- වරින් වර ඇති වන කෘමී සහ රෝග, අස්වැන්නට අහිතකර ලෙස බලපා තිබීම සහ ඒ සඳහා සුදුසු දිගුකාලීන විසඳුමක් සඳහා සැලැස්මක් හෝ අවධානයක් නොමැති කම.
- ආපදා යථා තත්ත්වයට පත් කිරීම හා වැළැක්වීම පිළිබඳව වගාකරුවන් අතර ඇති අවම දැනුම
- පසෙහි සාරවත් බව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති කම
- නාගරීකරණය නිසා ඉඩම් කැබලි කිරීමේ ප්‍රවණතාව වැඩි වි ඇත. එම සංඛ්‍යාව සහ ප්‍රමාණය හේතුවෙන් පොල් වගා බිම් අඩුවෙමින් පවතී.
- තාක්ෂණික දියුණුව නොමැතිකම, දුර්වල වතු කළමනාකරණය හා පරිමාණයේ ආර්ථිකයන් දුර්වල වීම හේතු කොටගෙන නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති අතර එමගින් අපගේ නිෂ්පාදනයන් සඳහා ඇති ඉල්ලුම කෙරෙහි මිල සංවේදී වෙළඳපළ තුළ අහිතකරව බලපා ඇත. මේ තත්වය වැඩි දියුණු කිරීමට වාණිජමය වශයෙන් පර්යේෂණ සිදු වන්නේද නැත.
- පොල් ඉඩම්වල ඵලදායිතාව අඛණ්ඩව අඩුවෙමින් පවතින අතර, එය ජාතික පොල් අස්වැන්න කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. මෙම ඵලදායී නොවන ඉඩම් ඉතා පහසුවෙන් දේපළ වෙළඳාම් සංවර්ධකයින් විසින් අත්පත් කර ගන්නා අතර මේ නිසා වගා කල හැකි අක්කර ප්‍රමාණය තවදුරටත් අඩු වෙමින් පවතී.
- වෙළඳපලවල්, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන් සහ සැකසුම් තාක්ෂණය පිළිබඳව වගාකරුවන්ගේ දැනුම මද බැවින් එය නිෂ්පාදන විවිධාංගීකරණයට බාධාවක් වේ.
- තමන්ගේ නිෂ්පාදන සහ ප්‍රධාන ගැනුම්කරුවන් සඳහා විනිවිද භාවයෙන් යුත් වෙළඳපොළක් හෝ මිල යාන්ත්‍රණයක් නොමැති බව වගාකරුවන්ගේ විශ්වාසය වන අතර නිසි සම්බන්ධීකරනයක් නොමැති වෙළඳුන්ගේ ජාල මඟින් ප්‍රමාණවත් මුදල් අත්තිකාරම්, මිල තොරතුරු හෝ එකතු කිරීමේ වේලාවන් සඳහා වන සම්බන්ධීකරණය කටයුතු විධිමත් අයුරින් සිදු නොවේ. ඩීසී මෝල්, පාම් තෙල් ආනයනකරුවන් සහ පිරිපහදු හිමිකරුවන්ගෙන් සමන්විත කමිටුවක් විසින් මිල පාලනය කරනු ලැබේ.
- මෙහෙයුම් පුලේ කිරීමට සහ වෙනත් වගාකරුවන්ගෙන් මිලදී ගැනීමට වගාකරුවන්ට අවශ්‍ය ප්‍රාග්ධනය සපයාගැනීමේ හිඟ තාවයක් තිබීම.
- පොල් කර්මාන්තයේ ආයෝජනය කිරීමෙන් ප්‍රතිලාභ උපයා ගැනීම සඳහා දිගු කාලයක් ගතවන බැවින් නව ආයෝජකයින් කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීම ඉතා අපහසුය.
- වගාකරුවන් හට තම ගැනුම්කරුවන් උදෙසා තවදුරටත් කැපවීමට හෝ වඩා හොඳ ගුණාත්මකභාවයක් ලබා දීමට අවශ්‍ය අවම මිල දිරිගැන්වීමක් හෝ තමන් විසින් වටහා ගත් ආර්ථික ප්‍රතිලාභ නොමැත.
- විශේෂයෙන් ශ්‍රමය සහ පොහොර ලබාගැනීමට වැයවන පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වී තිබිම.

- රටේ කාලගුණික හා දේශගුණික තත්වයන්හී අනපේක්ෂිත හා වේගවත් වෙනස්කම්, පොල් වගාවේ ඵලදායිතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. මේ හේතුවෙන් පොල් සැපයුමේ විශාල උච්චාවචනයක් සහ අනපේක්ෂිතභාවයක් ඇතිව තිබේ.
- හීනවන ශ්‍රම සැපයුම. උදා - පොල් නෙලන්නන්

## 2. වෙළෙඳුන් මුහුණ පාන බාධක

වෙළෙඳුන්, අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් හෝ ගොවීන් අතර ප්‍රවාහන පහසුකම් හා මුදල් ගනුදෙනු සේවා සලසයි. වෙළඳුන් පහත බාධක වලට මුහුණ දී සිටී.

- අත්තිකාරම් මුදල් ගෙවා මිලදී ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි ණය පහසුකම් සපයාගැනීමේ හිඟ තාවය. මෙය වෙළෙඳුන් හට ද්‍රවශීලතා ගැටළු ඇතිකරයි.
- කර්මාන්තයේ නිසි තොග සහ ගබඩා පහසුකම් නොමැති කම නිෂ්පාදනවල ගුණාත්මක භාවයට බලපායි.
- වෙළඳපල ඉහළ තරලතාවයකින් යුක්ත වන අතර, පොල් වෙළඳපොළ, සාමාන්‍ය වෙළඳ භාණ්ඩ වර්ගයන්හි වෙළඳපලක ස්වභාවයක් ගනී. එසේ වීමෙන් ඉහළ අස්ථාවරත්වයක් හට ගෙන ඇති අතර වෙළඳුන්ට බොහෝ අසීරුතාවයන් හට මුහුණ දීමට සිදුවී තිබේ.
- කර්මාන්තයේ වගාකරුවන් සහ වෙළඳුන් / නියෝජිතයන් අතර අවිශ්වාසයක් පවතියි.
- පොල් මිල රටේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයටද බලපෑමක් ඇති කරයි. එබැවින් පොල් වල මිල සමාජීය ගැටලුවක් බවට පත්ව ඇති අතර මෙවැනි අවස්ථාවන්හිදී වෙළඳපල මිල යාන්ත්‍රණයන්ගෙන් බැහැරව මිල තීරණය කිරීමට ප්‍රබල දේශපාලන බලපෑම් එල්ල වේ.

## 3. පොල් සැකසුම්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ බාධක

- පොල් සැකසුම් කර්මාන්තය සඳහා නිසි සැලසුමක්/ප්‍රතිපත්තියක්, ව්‍යුහයක් හෝ පාලන යාන්ත්‍රණයක් නොමැත. කර්මාන්තයේ තීරණ ගනු ලබන ඉහළ පෙළ නිලධාරීන් විසින් ගනු ලබන ඇතැම් ක්‍රියාමාර්ග, මෙම සාම්ප්‍රදායික කුඩා හා මධ්‍ය කාලීන සැකසුම් ක්‍රියාදාමයන් හට සෘණාත්මක බලපෑම් එල්ල කෙරෙන අතර ඔවුන්ට කර්මාන්තයෙන් ඉවත් වීමට සිදුවන බවක් හැඟේ.
- නිසි තත්ත්ත්ව ශ්‍රේණිගත කිරීමේ පද්ධතියක් නොමැති වීම.
- ඉහත සඳහන් සාධක දෙක හේතුවෙන් අනුකූල නොවන විදේශීය ආයෝජකයින්, නව සකසනයන් සහ ගුණාත්මක බවින් අඩු නිෂ්පාදනයන් වෙළඳපොළට පැමිණීම සඳහා දොරටු විවරවී ඇති අතර මෙය ශ්‍රී ලංකාවේ අවසාන නිෂ්පාදනයේ ගුණාත්මක භාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.
- අධික ප්‍රවාහන වියදම් හා ශ්‍රම පිරිවැය හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ ගොස් ඇත.
- යල් පැන ගිය තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ භාවිතය හේතුවෙන් සිදුවන අධික නාස්තිය හා ඵලදායිතාවය අඩුවීම.
- සැකසුම් කරුවන්හට අගය එකතු කිරීම සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන වෙළඳපල තොරතුරු හෝ නව තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම.
- සැකසුම් කරුවන්, ගැනුම්කරුවන් සහ වගාකරුවන් අතර ඇති මද විශ්වාසය නිසා බොහෝ ගනුදෙනු සිදුවන්නේ එකිනෙකට ස්වාධීනව යි. මෙම ක්‍රියාවලිය ගනුදෙනු තුළින් ලැබෙන ලාභය සහ සැපයුම් ක්‍රමයන්හට අහිතකර ලෙස බලපායි.
- අගය එකතු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ලැබෙන රජයේ දිරිගැන්වීම් අවම මට්ටමක පවතී.
- පාම් තෙල් ආනයන දිරිගන්වන තීරුබදු ප්‍රතිපත්තිය හේතුවෙන් එහි ආනයනයේ ඉහළ යාමක් දක්නට ලැබේ.
- වර්තමාන නිෂ්පාදන පහසුකම්වල ප්‍රමාණය මද බව

**4. අපනයනකරුවන් හා අපනයන ආයතන මුහුණපාන බාධක**

විශාලතම අභියෝගය වන්නේ රට පුරා විසිරී ඇති කුඩා වතු හිමියන්ගේ නිෂ්පාදනයන්, අපනයනය සඳහා එක්රැස් කිරීම තුළින් අපනයන පරිමාව වැඩි කර ගැනීමයි.

- මෑතකදී ශ්‍රී ලාංකික නිෂ්පාදනවල ගුණාත්මක මට්ටම් සහ ප්‍රමිතීන් පිළිබඳ ගැටළු ඉස්මතු වෙමින් පවතී. ගුණාත්මකභාවය දුර්වල වීම සහ අපගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් වැය වීම හේතුවෙන් ඉන්දියාව, වියට්නාමය වැනි තරඟකාරී රටවල් වලට වාසිදායි තත්ත්වයන් හිමි වෙමින් පවතී.

# 6. SWOT විශ්ලේෂණය

පොල් කර්මාන්තයේ බාහිර හා අභ්‍යන්තර පරිසරය අවබෝධ කර ගැනීම එහි ඉදිරි ගමන තීරණය කිරීමේදී ඉතා වැදගත් වේ. අවස්ථාවන් සහ තර්ජන ආකාරයෙන්, කර්මාන්තයේ බාහිර හා තරඟකාරී පරිසරයන් බලපෑම් ඇති කරන අතර, පොල් කර්මාන්තයේ ශක්තීන් සහ දුර්වලතා අර්ථ නිරූපණය කිරීමට එහි අභ්‍යන්තර පරිසරය සලකා බැලීම උපකාරී වේ.

***අභ්‍යන්තර පාරිසරික ශක්තීන්***

| | විස්තර | වගාව | මදය ආශ්‍රිත | මදය නොවන |
|---|---|---|---|---|
| 1 | දේශීය සංස්කෘතිය හා ආර්ථිකය සමඟ පොල් කර්මාන්තයේ ඇති ශක්තිමත් ඓතිහාසික සම්බන්ධතාවය. | ✓ | ✓ | ✓ |
| 2 | වසර ගණනාවක ඉතිහාසයක් ඇති කර්මාන්තයක් වීම. | ✓ | ✓ | ✓ |
| 3 | පොල් කර්මාන්තය සඳහා සුදුසු දේශගුණයක් සහ පාංශු තත්වයක් ශ්‍රී ලංකාව තුළ පැවතීම. | ✓ | ✓ | ✓ |
| 4 | ශ්‍රී ලංකාව තුළ විශාලතම භූමි ප්‍රමාණයක් ආවරණය කෙරෙන වතු බෝගය වීම. | ✓ | ✓ | ✓ |
| 5 | ශ්‍රී ලංකාව පුරා පොල් අක්කර 1,000,000 ක් වගා කර ඇත . | ✓ | ✓ | ✓ |
| 6 | දැනට වසරකට පොල් ගෙඩි මිලියන 2450 - 3000 ක් අතර ප්‍රමාණයක් ජනනය කරයි. | ✓ | | ✓ |
| 7 | වසර පුරා පවතින ඉල්ලුම සහ සැපයුම | ✓ | ✓ | ✓ |
| 8 | අනෙකුත් වගා හා සසඳන කල අඩු නඩත්තු පිරිවැය | ✓ | ✓ | ✓ |
| 9 | ශාකයේ ජීවන චක්‍රය පුරා ඒකාකාරී බෝග නිපැයුමක්. | ✓ | ✓ | ✓ |
| 10 | මෙහෙයුම සරල කිරීම තුළින් විශාල පිරිසකට ප්‍රවේශ වීමට හැකි කර්මාන්තයක් වීම. | | ✓ | ✓ |
| 11 | සාම්ප්‍රදායික/ දේශීය කර්මාන්තකරුවන් සිටීම. | | ✓ | ✓ |
| 12 | කර්මාන්තයේ උප අංශ දීර්ඝ කාලයක් සිට කර්මාන්තය හා සම්බන්ධ වී ඇති හෙයින් කර්මාන්ත දැනුම සුලබව පැවතීම | | | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| 13 | පොල් ආයතන 3 ක් විධිමත් ලෙස ස්ථාපිත කිරීම | ✓ | ✓ | ✓ |
| 14 | (1972 පොල් සංවර්ධන පනත යටතේ පර්යේෂණ ආයතනය, පොල් වගා මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරිය). | ✓ | | |
| 15 | දේශීය වශයෙන් ලබා ගත හැකි හොඳ ජානමය ද්‍රව්‍ය. | | ✓ | |
| 16 | ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනවල ස්වභාවික ගුණාත්මකභාවය සහ ආවේණික රසය. | | | ✓ |
| 17 | ශ්‍රී ලංකාවේ පොල් කොහුබත් අංශයේ අද්විතීය තන්තු නිස්සාරණ ක්‍රමය. | | ✓ | ✓ |
| 18 | නිෂ්පාදන ක්‍රියාව තුළට කාබනික (ස්වභාවික) හා සාධාරණ වෙළඳ සංකල්ප යෙදීම. (මදය සහ මදය නොවන) | | ✓ | ✓ |
| 19 | ස්ථාපිත වූ පොල් කිරි, වියළන ලද පොල්, නැවුම් පොල්තෙල්, කොහුබත් යනාදී නිෂ්පාදනයන් රැසක් සහිත ජාලයක් පැවතීම. | ✓ | ✓ | ✓ |
| 20 | පොල් ගසේ සියලුම කොටස් පරිභෝජනය කිරීමේ හැකියාව. | ✓ | ✓ | |
| 21 | මුළු රටේම ප්‍රධාන ආහාර ප්‍රභවයක් වන බැවින් එය අත්‍යවශ්‍ය බෝගයකි. | ✓ | | |
| 22 | විවිධ කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම. | ✓ | ✓ | ✓ |

***දුර්වලතා***

| | විස්තර | වගාව | මදය ආශ්‍රිත | මදය නොවන |
|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික භාණ්ඩයක් හා අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කිරීම කෙරෙහි අවධානය යොමුව තිබීම. | | ✓ | ✓ |
| 2 | නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලිය තුළ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. | | ✓ | ✓ |
| 3 | කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ සහ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ නිපැයුම්කරුවන්හට අරමුදල් රැස් කිරීමේ දුෂ්කරතා | | ✓ | ✓ |
| 4 | වටිනාකම් දාමයේ යටිතල සේවා ව්‍යුහයේ දුර්වලතා | ✓ | ✓ | ✓ |
| 5 | කර්මාන්තය සම්බන්ධ ගුණාත්මක තොරතුරු හිඟ වීම. | ✓ | ✓ | ✓ |
| 6 | ශාක වයසට යාම එහි අස්වැන්න කෙරෙහි අහිතකර ලෙස බලපායි. | ✓ | ✓ | ✓ |
| 7 | වටිනාකම් දාමය තුළ තාක්ෂණය පිළිබඳ වැඩි දැනුමක් නොමැතිකම. | ✓ | ✓ | ✓ |
| 8 | වටිනාකම් දාමය තුළ තාක්ෂණයේ භාවිතය අවම මට්ටමක පැවතීම. | ✓ | ✓ | ✓ |
| 9 | ශ්‍රම බලකායේ හිඟය. | ✓ | ✓ | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| 10 | නිෂ්පාදන ක්‍රියාවලිය තුළ සිදු වෙන අධික නාස්තිය. | ✓ | ✓ | ✓ |
| 11 | දේශීය නියාමන යාන්ත්‍රණයේ පවතින විෂමතා, විනිවිදභාවයේ ඌණතා, අසාධාරණකම් සහ අඩුපාඩු. | ✓ | ✓ | ✓ |
| 12 | වගා බිම් බොහොමයක් නිසි ලෙස කළමනාකරණය සහ නඩත්තු නොකෙරේ. | ✓ | | |
| 13 | අමුද්‍රව්‍ය හිඟය, වගාකරුවන්ට අමුද්‍රව්‍ය ලබා ගැනීමට බාධාවක් වේ. | ✓ | | |
| 14 | නැවත වගාව සඳහා දිරිගැන්වීමක් නොමැතිකම | ✓ | | |
| 15 | ඉහළ වටිනාකමක් සහිත විවිධාංගීකරණයවූ පොල් නිෂ්පාදන නිපදවීමට දිරිගැන්වීම් නොමැතිකම. | | ✓ | ✓ |
| 16 | වගාකරුවන්ගේ අඩු අධ්‍යාපන මට්ටම. | ✓ | | |
| 17 | කර්මාන්තය තුළ වාණිජමය අවධානයේ මද භාවය (විශේෂයෙන් වගා ආශ්‍රිත) | ✓ | | ✓ |
| 18 | කර්මාන්තයේ සමහර උප අංශවල, 80% කට වඩා වැඩි ප්‍රමාණයක්, (තනි) හිමිකාරිත්වයන් ලෙස ක්‍රියාත්මක වන අතර ඒවායේ මෙහෙයුම් පුළුල් වීම සහ නැවත ආයෝජනය කිරීම ඉතා දුර්ලභ වන බැවින්, ඉහළ පරිමාණයේ ආර්ථිකයන් හිමි කරගැනීමේ අවස්ථා අහිමි වී යයි. | | | ✓ |
| 19 | තිරසාරත්වය සහ නව්‍යකරණය ඉහළ නැංවීම තුළින් කර්මාන්තයේ තත්වය වැඩි දියුණු කිරීමේ අවධානය මඳ වීම. | | ✓ | ✓ |
| 20 | කර්මාන්තයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය හා සමගිය නොමැතිකම. | ✓ | ✓ | ✓ |
| 21 | ජාත්‍යාන්තර වෙළෙඳපොළ තුළ සමහර දේශීය සමාගම් එකිනෙකාට එරෙහිව සදාචාර විරෝධී වෙළඳ ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම දේශීය කර්මාන්තයේ කීර්තියට හානි කරයි. | | ✓ | ✓ |
| 22 | නිසි වෙළඳ නාමකරණය, වෙළඳ හා අලෙවිකරණ උපාය මාර්ග නොමැති වීම. | | ✓ | ✓ |
| 23 | සදාචාරාත්මක හා පරිසර හිතකාමී ක්‍රියා පිළිවෙත් අනුගමනය නොකිරීම. | | ✓ | ✓ |

*බාහිර පරිසර අවස්ථාවන්*

| | විස්තර | වගාව | මදය ආශ්‍රිත | මදය නොවන |
|---|---|---|---|---|
| 1 | අනාගත වැවිලි ව්‍යාප්තිය දිරිගැන්වීමේ යාන්ත්‍රණයක් ලෙස ගෙවතු වගා ක්‍රමය ප්‍රවර්ධනය කිරීම. | ✓ | | |
| 2 | පොල් ඉඩම් අක්කර ප්‍රමාණය වැඩි කිරීම සඳහා යොදා ගත හැකි සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයට පිටත ඉඩම් පැවතීම | ✓ | | |
| 3 | උතුරු හා නැගෙනහිර පළාත්වල පොල් වගාව ප්‍රවර්ධනය කිරීම වේගවත් වීම. | ✓ | | |
| 4 | පවත්නා ඒක-බෝග පොල් ඉඩම් අන්තර් බෝග ගොවිතැන සඳහා වැඩිදියුණු කිරීමේ හැකියාව. | ✓ | | |
| 5 | භාවිතයට නොගත් අමුද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය ප්‍රභවයන් තිබීම. | | | ✓ |
| 6 | පොල් ගසේ සෑම කොටසක්ම විවිධ කර්මාන්ත සඳහා භාවිතා කිරීමේ හැකියාව. | ✓ | ✓ | ✓ |
| 7 | ආරම්භක සහ නඩත්තු කිරීමේ පහසුව හේතුවෙන් පුද්ගලික අංශය කර්මාන්තයට පිවිසීමට පෙළඹවීම සහ ප්‍රවර්ධනය කිරීමේ හැකියාව. | ✓ | | |
| 8 | ගෝලීය වෙළඳපොලේ ශ්‍රී ලංකාවේ පොල් සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම | | ✓ | ✓ |
| 9 | පරිසර හිතකාමී, රසායනික ද්‍රව්‍ය භාවිතා නොකළ ස්වාභාවික නිෂ්පාදන කෙරෙහි පාරිභෝගික ඉල්ලුම යොමු වීමේ ප්‍රවණතාවය ඉහල යාමත් සමග ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවයට දායක වීම. | | ✓ | ✓ |
| 10 | ආහාරයට ගත හැකි පොල් ආශ්‍රිත නිෂ්පාදනවල පෝෂණ හා ධනාත්මක සෞඛ්‍යමය බලපෑම්. | ✓ | | |
| 11 | ශිල්පීය සහ කලාත්මක පොල් නිෂ්පාදන වර්ධනය කිරීමට දේශීය වෙළඳපලට සංචාරක අංශය සමඟ සම්බන්ධ වීමේ හැකියාව. | | | ✓ |
| 12 | තන්තු අංශයේ ඉතා ඉහළ අගයක් එකතු කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ හැකියාව. | | | ✓ |
| 13 | තරඟකාරී උපස්ථර නිෂ්පාදන බොහොමයක් පාරිසරික සීමාවන්ට මුහුණදී ඇති බැවින් දේශීය පොල් උපස්ථර සඳහා ගෝලීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. | | | ✓ |
| 14 | සාමාන්‍යයෙන් නාස්තියට පාත්‍ර වන පොල් වතුර වැනි වූ කොටස් භාවිතා කිරීමේ හැකියාව ඉහළ නංවා, අගය එකතු කිරීම, නිවැරදි මෙහෙයුම් ක්‍රම සහ යහ පුරුදු දිරිගැන්වීමෙන් අපනයන ආදායම ඉහළ නැංවීය හැක . | | | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| 15 | කෘතිම නිෂ්පාදන ද්‍රව්‍ය (synthetic) සඳහා විකල්පයක් වීම. | | | ✓ |
| 16 | කොහු උපස්ථර සඳහා ඉහළ ඉල්ලුමක්. | | | ✓ |
| 17 | පොල් කිරි මත පදනම් වූ නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපොළ පුළුල් වීම. | | ✓ | |
| 18 | විශේෂයෙන් කොහු පදනම් කරගත් නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපොළ පුළුල් කිරීමේ හැකියාව. | | | ✓ |
| 19 | ගෘහස්ථ පොල්තෙල් කර්මාන්තයේ විශාල අවස්ථාවක් පවතී. | | ✓ | |
| 20 | ශ්‍රී ලංකා වියලි පොල් (DC) හි අද්විතීය රසය ඉහළ ඉල්ලුමක් ඇති කළ හැකිය. | | ✓ | |
| 21 | බටහිර වෙළඳපොලේ වර්ධන අවස්ථා. | | ✓ | ✓ |
| 22 | චීනය සහ රුසියාව වැනි නැගී එන උපස්ථර වෙළෙඳපොලවල විශාල වර්ධන වේගය. | | | ✓ |
| 23 | සංවර්ධිත රටවල් සමග වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ හැකියාව. | | ✓ | ✓ |
| 24 | කාබන් අනුක්‍රමණය | ✓ | ✓ | ✓ |
| 25 | වතු ක්ෂේත්‍රය නැවත පණ ගැන්වීම සඳහා විදේශීය ප්‍රදාන ලබා ගැනීමේ හැකියාව. | ✓ | | |

***තර්ජන***

| | විස්තර | වගාව | මදය ආශ්‍රිත | මදය නොවන |
|---|---|---|---|---|
| 1 | ගස්වල වයස්ගත වීම. | ✓ | ✓ | ✓ |
| 2 | පළිබෝධ සහ රෝග වලින් එල්ලවන බලපෑම වැඩි වීම. | ✓ | ✓ | ✓ |
| 3 | ඉඩම් ප්‍රමාණ කැබලි වීම | ✓ | ✓ | ✓ |
| 4 | අස්වැන්න සඳහා ගතවන කාලය. | ✓ | | |
| 5 | නිෂ්පාදන පිරිවැය ඉහළ යාම. | ✓ | ✓ | ✓ |
| 6 | ජල භාවිතය හා සංරක්ෂණ ගැටළු. | ✓ | ✓ | ✓ |
| 7 | දැවමය අරමුණු සඳහා පොල් ගස් භාවිතය වැඩි කිරීම. | ✓ | | |
| 8 | රජයේ ප්‍රතිපත්ති නිරන්තරයෙන් වෙනස් වීම. | ✓ | ✓ | ✓ |
| 9 | දේශගුණික විපර්යාස හා ස්වාභාවික විපත් වල බලපෑම්. | ✓ | ✓ | ✓ |
| 10 | පරිභෝජන රටාවේ වෙනස්වීම් සහ පාරිභෝගිකයින්ගේ ඉල්ලුම. | | ✓ | |
| 11 | ගෝලීය උණුසුම - අනපේක්ෂිත හා අක්‍රමවත් වර්ෂාපතන රටා. | ✓ | ✓ | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| 12 | තරඟකාරී රටවල සහ වෙළඳපලවල ගුණාත්මක ප්‍රමිතීන් ඉහළ යාම. | | ✓ | ✓ |
| 13 | පොල්තෙල් භාවිතය පිළිබඳ ඍණාත්මක සෞඛ්‍ය විශ්වාසයන්. | | ✓ | |
| 14 | ආදේශක නිෂ්පාදන මතුවීම. | | ✓ | ✓ |
| 15 | ඉන්දියාව, ඉන්දුනීසියාව, පිලිපීනය වැනි රටවලින් එල්ලවන තරඟය. | ✓ | ✓ | ✓ |
| 16 | වෙනත් රටවලින් අඩු මිලට පොල් සැපයීම . | | ✓ | ✓ |
| 17 | ජාත්‍යන්තර මිල උච්චාවචනයන්. | | ✓ | |

## 7. අරමුණු

මෙම උපායමාර්ගය ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට බලපාන තීරණාත්මක සාධක ආමන්ත්‍රණය කිරීම සඳහා වූ පූර්ණ ප්‍රතිචාරයකි. එය වෙළඳපල අවස්ථා ග්‍රහණය කරගැනීමට පාර්ශවකරුවන්ගේ, හවුල්කරුවන්ගේ , පුද්ගලික අංශයේ, උපකාරක ආයතන සහ රජයේ ආයතනවල ක්‍රියාකාරීත්වයේ අඩුපාඩු පියවාගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ කිරීමට ඉලක්ක කරයි.

මෙම උපායමාර්ගය සමස්ත පොල් වටිනාකම් දාමය හරහා සාර්ථකව ක්‍රියාත්මක කල හැකි පරිපූර්ණ ප්‍රවේශයක් යෝජනා කරයි.

එහි යෝජනා කෙරෙන වෙනස්කම් සාර්ථකව ක්‍රියාවට නැංවීම නම් ට සියලු පාර්ශවකරුවන්ගේ තිරසාර කැපවීමක් අවශ්‍ය වනු ඇත.

මෙම උපාය මාර්ගයේ දිගුකාලීන පරමාර්ථය වන්නේ, පුළුල් නිෂ්පාදන කළඹක් නිෂ්පාදනය කිරීම මගින් සහ කර්මාන්තය නිසි ලෙස වාණිජකරණය කිරීම තුළින් දේශීය පොල් නිෂ්පාදන ආදායම උපරිම මට්ටමකට ගෙන ඒමයි.

## 8. ඉලක්ක සහ උපායමාර්ග

උපායමාර්ගික අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ 8 ක් ඇත.

1. නිෂ්පාදන හා වෙළඳ විවිධාන්ගීකරණය පිළිබඳ අවදානය යොමුකිරීම
2. පවත්නා වගාවන්හි ඵලදායිතාව උපරිම කිරීම
3. අංශ විවිධාංගීකරණය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන් හට නිසි ලෙස සැලසුම් කිරීමට හැකිවන පරිදි වෙළඳපල ගුණාත්මකභාවය, නිෂ්පාදනය සහ ව්‍යාපාර ශක්‍යතාවය පිළිබඳ තොරතුරු අඛණ්ඩව සැපයීමේ හැකියාව දියුණු කිරීම.
4. නිෂ්පාදන හා වෙළඳපල විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කරන්න
5. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සහ ආයෝජනය කිරීමට හැකියාව සලසන මූල්‍ය යාන්ත්‍රණ සංවර්ධනය කිරීම
6. පොල් නිෂ්පාදන අගය එකතු කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා පොල් සැකසුම් කර්මාන්තයක් සංවර්ධනය කිරීම
7. පොල් කර්මාන්තයේ විවිධ අංශයන්හි අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා උපකාරක සේවා වැඩි දියුණු කිරීම
8. පොල් අංශය කළමනාකරණය කිරීම සඳහා සුදුසු පරිපාලන හා නියාමන රාමු ඇති කිරීම සඳහා පොල් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණ මණ්ඩලයක් පිහිටුවීම.

**අරමුණ 1: නිෂ්පාදන හා වෙළඳපල බෙදා හැරීම කෙරෙහි අවධානය කිරීම.**

<u>නිෂ්පාදන විවිධාංගීකරණය</u>

නව සහ පවත්නා වෙළඳපල සඳහා නව නිෂ්පාදන සංවර්ධනය කිරීම පොල් කර්මාන්තයේ අනාගතය වනු ඇත. පවත්නා නිෂ්පාදන මත ඕනෑවට වඩා රඳා සිටිනවා වෙනුවට, විශ්ව විද්‍යාල සහ අලෙවිකරණ වෘත්තිකයන්ගේ සහාය ඇතිව වැඩි වටිනාකම් එකතු කිරීම සහ මුළුමනින්ම නව නිෂ්පාදන සංවර්ධනය කිරීමේ අවස්ථා අඛණ්ඩව පර්යේෂණය කළ යුතුය.

නව හා වැඩිදියුණු කළ, දෙමුහුන්, පළිබෝධ සහ නියඟයට ඔරොත්තු දෙන ශාක වර්ග වලට පිවිසීම තුළින් පොල් ගසේ ඵලදායිතාව ඉහළ නැංවීමට කාලයයි. මෙය සිදු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය සඳහා ප්‍රමාණවත් හා නිවැරදි ආයෝජනයක් කිරීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ පොල් වගා කරන්නන්ගෙන් බහුතරයක් නිෂ්පාදනය කළේ එක් කොප්පරා වර්ගයක් පමණක් වන අතර එමගින් වගාකරුවන්ගේ ආදායම බොහෝ දුරට තීරණය වන්නේ සෑම මාස තුනකට වරක් ලබා ගන්නා කොප්රා අලෙවියෙනි. ඒකාබද්ධ පොල් සැකසුම් හරහා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමේ උත්සාහයන් වන්නේ කොප්රා තෙල් නිෂ්පාදන වන ෂෙල් වෙඩි, තන්තු, පොල් වතුර සහ පොල් දැව වැනි වගාකරුවන්ගේ ආදායම් ප්‍රභවයන් වැඩි කිරීමයි.

ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමග දිගුකාලීන තරගයක නිරත වීමට නම්, අපගේ නිෂ්පාදන විවිධාන්ගීකරණ උපාය මාර්ගය තුලදී ක්‍රියාවලි නවෝත්පාදනය, ඉහල වටිනාකම් සහිත නිෂ්පාදන එකතුකිරීම සහ ශ්‍රීලාංකීය පොල් නිෂ්පාදන සදාචාරාත්මක සහ තිරසාර නිෂ්පාදන ලෙස ප්‍රවර්ධනය කිරීම කල යුතුය.

ශ්‍රී ලංකාව සාම්ප්‍රදායිකව ප්‍රථමික පොල් අපනයනකරුවෙකි. එබැවින් රටක් ලෙස අපට ලැබෙන ආදායම සහ ලාභ ආන්තිකය අවම සහ සීමා සහිතය. අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ අගය එකතු කළ ක්‍රියාවලීන් සහ නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ද්විතීයික නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම වැදගත් ය. එමගින් අපනයන ආදායම ඉහළ යනු ඇත. මෙයට පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ හැකිය.

- නැවුම් පොල්තෙල්
- පොල් වතුර කර්මාන්ත
- පානය කිරීම සඳහා පොල් කිරි/ රස කළ කිරි
- පොල් පේස්ට්
- පොල් ආශ්‍රිත ආහරණ කර්මාන්ත

අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ එක් වැදගත් සාධකයක් වන්නේ පොල් භාවිතයට නොගත් කොටස් භාවිතය වැඩි කිරීම යි. පොල්වල සියලුම කොටස්වල වැදගත්කම හා මූල්‍ය වටිනාකම පිළිබඳව වගාකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් යන්නේ දේශීය පරිභෝජනයට ය. අපනයන ආදායමේ අලාභය සලකා බැලීමේදී එය අවස්ථාව අහිමිවීමකි. ගෘහස්ථ පරිභෝජනය හා පරිභෝජන රටාව තුළ විශාල නාස්තියක් පවතී. එබැවින් පොල් නිසි ලෙස භාවිතා කිරීම සහ ගෘහස්ථ පරිභෝජනයේ නාස්තිය අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වැදගත්ය. මීට අමතරව, දැරිය හැකි මිලගණන් සහිත නිෂ්පාදන හඳුන්වා දීමෙන් සහ නිසි පාලනයන් තුළින් උසස් තත්ත්වයේ සහ ආරක්ෂාව සහතික කිරීමෙන් දේශීය වෙළඳපොලේ ඇති විකල්පයන් පිළිබඳ පාරිභෝගික විශ්වාසය වැඩි කර ගත හැකිය.

වෙළෙඳපල විවිධාංගීකරණය

ඇතැම් වර්තමාන වෙළඳපොළවල් මත අධි රඳා පැවැත්ම වැළැක්වීම සඳහා විකල්ප ගෝලීය වෙළඳපළ අවස්ථා නිරන්තරයෙන් සෙවිය යුතුය. මෙයට හේතුව වන්නේ ඇතැම් රටවල් විසින් ඔවුන්ගේ වෙළඳපල හැසිරවීමේ බලය යොදාගනිමින් වාසි ලබා ගැනීමට උත්සාහ කිරීමයි.

රටක් ලෙස අපගේ සාම්ප්‍රදායික පාරිභෝගික රටවලට පොල් අපනයනය කිරීම දිගටම කරගෙන යන්නෙමු. අපගේ නිෂ්පාදන විකිණීම සඳහා විකල්ප වෙළඳපොලවල් සොයා බැලීමට කාලයයි. සාම්ප්‍රදායික පොල් හා වියළන ලද පොල් වලට අමතරව ෆයිබර් සහ කොයර් වැනි නිෂ්පාදන කෙරෙහි අප අවධානය යොමු කළ යුතු අතර, දිගුකාලීන සම්බන්ධතාවය සහ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා මත පමණක් රඳා නොසිට නව හා යාවත්කාලීන වූ නව වෙළෙඳපල මාර්ග සහ අලෙවිකරණ ප්‍රවේශයන් පිළිබඳ පර්යේෂණ කිරීම වැදගත් ය.

නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගතහැකි හොඳම ක්‍රමයක් නම් ගෝලීය කෘෂි ප්‍රදර්ශන සහ ප්‍රදර්ශනවලට සහභාගී වීමයි. හැකි නම්, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කෘෂි ප්‍රදර්ශනයක් සංවිධානය කර සියලු පාරිභෝගික රටවලට ආරාධනා කළ යුතුය.

රටක් ලෙස අප සිලෝන් තේ ලෙස නම්දරා ඇත. නමුත් ලංකා පොල් සන්නාමය සඳහා අප ලබා දී ඇති උත්සාහය ප්‍රමාණවත් නොවේ. අපේ පොල් වල අද්විතීය සුවඳ හා ගුණාත්මකභාවය සැලකිල්ලට ගෙන මෙය දුෂ්කර කාර්යයක් නොවේ.

මෙම ඉලක්කය සඳහා සලකා බැලිය යුතු නිර්ණායක වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

| | **මිනුම් / නිර්ණායක** |
|---|---|
| **1.1** | දෙමුහුන්, නියගයට ඔරොත්තු දෙන සහ අවම ඉඩකඩ අවශ්‍ය ප්‍රභේද උපයෝගී කරගනිමින් කේන්ද්‍රගත පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති හරහා යාවත්කාලීන සහ වැඩි අස්වැන්නක් ලබාදෙන පොල් ප්‍රභේද හඳුන්වාදීම;<br>• හෙක්ටයාරයකට යොදන නව ගස් සංඛ්‍යාව වැඩිකිරීම සහ විවිධ ප්‍රභේද හඳුන්වා දීම<br>    • දෙමුහුන් ප්‍රභේද<br>    • නියගයට ඔරෝත්තු දෙන ප්‍රතිරෝධක ප්‍රභේද<br>    • අඩු ඉඩක් භාවිතා කිරීමට හැකි ප්‍රභේද<br>• ඵලදාව වැඩි කිරීම සඳහා විවිධ ප්‍රභේද හඳුන්වාදීම<br>    • දෙමුහුන් ප්‍රභේද<br>    • නියගයට ඔරෝත්තු දෙන ප්‍රතිරෝධක ප්‍රභේද<br>    • අඩු ඉඩක් භාවිතා කිරීමට හැකි ප්‍රභේද<br>• ඉහළ අස්වැන්නක් ලබාදෙන ගස් වගාකිරීම වැඩි කිරීම<br>    • දෙමුහුන් ප්‍රභේද<br>    • නියගයට ඔරෝත්තු දෙන ප්‍රතිරෝධක ප්‍රභේද<br>    • අඩු ඉඩක් භාවිතා කිරීමට හැකි ප්‍රභේද |
| **1.2** | ශ්‍රී ලංකාවේ අගය එකතු කළ පොල් නිෂ්පාදන නාමාවලියක් සකස් කිරීම |
| **1.3** | (නිෂ්පාදනය, ප්‍රදේශය, නිෂ්පාදකයා, ප්‍රමාණය, අපනයන ප්‍රමාණය, ආදායම) |
| **1.4** | 1.2 සහ 1.3 හි යෝජනා කර ඇති ඉහත අධ්‍යයන දෙක මත පදනම්ව ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ඇති අවකාශය තේරුම් ගැනීම |
| **1.5** | පැහැදිලි කෙටි කාලීන (වසර 1 ට අඩු), මධ්‍ය කාලීන (අවුරුදු 1 -3) සහ දිගු කාලීන (අවුරුදු 3 - 5) සැලසුම් සහිත පැහැදිලි කාලරාමු සමඟ පරතරය විශ්ලේෂණය (1.4) හි දක්වා ඇති පරතරය පියවා ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් යෝජනා කිරීම, |

| | |
|---|---|
| **1.6** | පොල් සහ ගසෙහි භාවිතයට නොගත් කොටස භාවිත කිරීමේ ක්‍රමයක් ගවේෂණය කර හඳුන්වා දීම. මෙය ප්‍රවර්ධනය කිරීම සඳහා නව අදහස් හා යෝජනා සඳහා පර්යේෂකයන්, වගාකරුවන් සහ වෙනත් අදාළ පාර්ශවයන් අතර තරඟයක් සංවිධානය කිරීම. |
| **1.7** | මුළු රටම ආවරණය වන පරිදි නිසි කාල රාමුව සහිත පොල් හා ගසෙහි භාවිතයට නොගත් කොටස් භාවිතා කිරීම පිළිබඳ දිවයින පුරා පුහුණුව හා දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම |
| **1.8** | පැහැදිලි කාලරාමු, වගකීම් සහ වගවීම සමඟ අමු ලෙලි එකතු කිරීම බිලියන 2 දක්වා වැඩි කිරීම සඳහා ප්‍රතිශීලී හා වර්ධනාත්මක සැලැස්මක් සකස් කිරීම. |
| 1.9 | දේශීය වෙළඳපොලේ පොල් සඳහා විකල්ප නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| **1.10** | දේශීය වෙළඳපොලේ වෙනස් කළ හැකි නිෂ්පාදන සඳහා සහතිකයක් සමඟ ගුණාත්මක ප්‍රමිතීන් / මාර්ගෝපදේශ හඳුන්වා දීම. |
| **1.11** | පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මදය ආශ්‍රිත නිෂ්පාදන සඳහා ආනයන සැලැස්මක් හඳුන්වා දීම.<br>• ගෘහස්ථ වගාකරුවන් ආරක්ෂා කිරීම සඳහා ගාස්තු<br>• දේශීය සැපයුම මත පදනම්ව යෝජිත පොල් ලේකම් කාර්යාලය විසින් තීරණය කළ යුතු ආනයන ප්‍රමාණය සීමා කිරීමට සහ පාලනය කිරීමට ඇති හැකියාව<br>• ආනයනික නිෂ්පාදන සඳහා අවම තත්ත්ව ප්‍රමිතියක් සහ අනිවාර්ය තත්ත්ව සහතිකයක ලබාදීමේ ක්‍රමවේදයක් ලබාදීම<br>• පැහැදිලි කාල නියමයන්, වගකීම් සහ වගවීම් සහිතව පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ආනයනය අවම කිරීම සහ දේශීය නිෂ්පාදනය වැඩි කිරීමට සැලැස්මක් තිබීම. |
| **1.12** | සිලෝන් පොල් වෙළඳ නාමය ගෝලීයව ප්‍රවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක වෙළඳ නාම සැලැස්මක් සකස් කිරීම. |
| **1.13** | පහත සඳහන් අරමුණු සහිතව අලෙවිකරණ පර්යේෂණ ආයතනය පිහිටුවීම / ප්‍රතිසංස්කරණය කිරීම<br>• නිෂ්පාදන කාණ්ඩය අනුව පහත සඳහන් තොරතුරු සමඟ අපගේ නිෂ්පාදන විකුණන පවත්නා ගෝලීය වෙළඳපොළවල දත්ත පදනමක් සංවර්ධනය කිරීම<br>• ශ්‍රී ලංකාව එම වෙළඳපලෙහි සහ නිෂ්පාදන කාණ්ඩයේ වෙළඳපල ගැන නොසලකා එම කාණ්ඩ අනුව පොල් හා ආශ්‍රිත නිෂ්පාදන මුළු වෙළඳපග වර්ගීකරණයක් කිරීම<br>    ◦ එක් එක් වෙළඳපල සහ නිෂ්පාදන කාණ්ඩය මත ශ්‍රී ලංකා වෙළඳපල විනිවිද යාම (සමස්ත වෙළඳපොළේ ප්‍රතිශතයක් ලෙස) |
| **1.14** | ඉහත අධ්‍යනය මත පදනම්ව වෙළඳපල විනිවිද යාම සහ වෙළඳපල විභවය අනුව ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ඇති හිඩැස් තේරුම් ගැනීම |
| **1.15** | පැහැදිලි කෙටි කාලීන (වසර 1 ට අඩු), මධ්‍ය කාලීන (අවුරුදු 1 -3) සහ පැහැදිලි කාලරාමු සහිත දිගු කාලීන (අවුරුදු 3 - 5) සැලසුම් සමඟ පරතරය විශ්ලේෂණය (1.14) හි දක්වා ඇති පරතරය පියවා ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් යෝජනා කිරීම. පහත සඳහන් උපාය මාර්ග ආවරණය වන වගකීම් සහ වගවීම්.<br>• විනිවිද යාම - (වර්තමාන වෙළඳපල තුළ වර්තමාන නිෂ්පාදන කාණ්ඩ පුළුල් කරන්නේ කෙසේද?<br>• වෙළඳපල සංවර්ධන උපායමාර්ගය - (වර්තමාන නිෂ්පාදන කාණ්ඩ නව වෙළඳපල වෙත ප්රවර්ධනය කරන්නේ කෙසේද)<br>• නිෂ්පාදන සංවර්ධනය - (වත්මන් වෙළඳපල තුළ නව නිෂ්පාදන කාණ්ඩ ප්‍රවර්ධනය කරන්නේ කෙසේද)<br>• විවිධාංගීකරණය - (නව නිෂ්පාදන කාණ්ඩ නව වෙළඳපල වෙත හඳුන්වා දෙන්නේ කෙසේද) |

| | |
|---|---|
| **1.16** | ප්‍රවර්ධනය සඳහා දේශීය දැනුවත්භාවය / අලෙවිකරණ සැලැස්මක් / ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම<br>පොල් ලෙලී / කටු වල වටිනාකම පිළිබඳ දැනුවත්භාවය<br>• පොල් කිරි සහ පොල්තෙල් පිළිබඳ වැරදි වැටහීම ඉවත් කිරීම |
| **1.17** | අපනයන නිෂ්පාදන සඳහා ෆයිටොසැනිටරි සහතිකයක් ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම |
| **1.18** | ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ඇති විය හැකි ගෝලීය ව්‍යාපාරික හවුල්කාරිත්වයන් ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් පොල් කර්මාන්ත සඳහා ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම. |
| **1.19** | පැහැදිලි ඉලක්ක සහිත ජාත්‍යන්තර කෘෂි අලෙවිකරණ ප්‍රදර්ශනවලට සහභාගී වීමට නිසි දින දර්ශනයක් තබා ගැනීම. |

**අරමුණ 2: පවත්නා වගාවන් හී එදායිතාව උපරිම කිරීම**

පොල් ඵලදායිතාව ඉහළ නැංවීම සහ වගාකරුවන්ගේ ආදායම සහ සුභසාධනය වැඩි දියුණු කිරීමේ අරමුණින් ප්‍රදේශයේ සම්පත් භාවිතය හා කළමනාකරණය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා පියවර ගැනීම අවශ්‍ය වේ.

තාක්ෂණික සංරක්ෂණය වැඩිදියුණු කිරීම, පසු අස්වනු ප්‍රතිකාර හා අඛණ්ඩ නිෂ්පාදන සැකසුම් ඇතුළු ඵලදායී වගාකරුවන්ගේ වැඩ ආචාරධර්ම කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් සංවිධාන සංවර්ධනයට හා සංස්කෘතියට ප්‍රමුඛතාවය දී වගාකරුවන්ගේ සම්පත් සංවර්ධනය කිරීම.

ඉඩම් පුනරුත්ථාපනය සඳහා පහත සඳහන් උපාය මාර්ග දෙකක් ඇතුළත් වේ.

**අ.** ඉඩම් හා වගාවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම

**ආ.** ක්‍රියාවලි වැඩිදියුණු කිරීම

**අ. ඉඩම් හා වගාවන් හී ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

මෙම උපායමාර්ගය යටතේ අවධානය යොමු කළ යුතු අංශ 3 ක් ඇත

i. පොල් බෝගවල අස්වැන්න වැඩිදියුණු කිරීම
ii. තිරසාර ඉඩම් සංවර්ධනය හා කළමනාකරණය
iii. යටිතල පහසුකම් සංවර්ධනය

<u>පොල් බෝග වල අස්වැන්න වැඩි දියුණු කිරීම</u>

ඉහත උපායමාර්ගික අරමුණු හි සඳහන් කර ඇති පරිදි දෙමුහුන්, පළිබෝධ සහ නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද සහ අඩු භූමි ප්‍රමාණයක් අවශ්‍ය ප්‍රභේද පිළිබඳව පර්යේෂණ කිරීම ඉතා වැදගත් වේ. කර්මාන්තයේ ප්‍රධාන ගැටළුවක් වන්නේ පළිබෝධ සහ රෝගවල බලපෑමයි. (උදා: මයිටා, කළු කුරුමිණියා සහ රතු කුරුමිණි). රෝග සහ පළිබෝධ පාලනය කිරීම සඳහා වගාකරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහනක් නොමැත.

<u>තිරසාර ඉඩම් සංවර්ධනය හා වතු කළමනාකරණය</u>

කර්මාන්තයේ ඇති ලොකුම තර්ජනය වන්නේ නේවාසික කටයුතු සඳහා පොල් ඉඩම් යොදා ගැනීමයි. මෙය කළමනාකරණය කිරීම සඳහා නිසි අවධානයක් හෝ පාලන යාන්ත්‍රණයක් නොමැත.

පොල් නිෂ්පාදනය වැඩි කිරීමට ඇති ලොකුම අවස්ථාව වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල පොල් සිටුවීම ප්‍රවර්ධනය කිරීමයි. මෙම ක්ෂේත්‍රයන්හි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

ගෙවතු වල පොල් ගස් සිටුවීමට දිරිගැන්වීම සඳහා දරන උත්සාහය ප්‍රමාණවත් නොවේ. පොල් පරිභෝජනය සම්බන්ධයෙන් පවුල් ස්වයංපෝෂිත වන අතර එමගින් ගෘහස්ථ ඉල්ලුම අඩු කර ගත හැකිය.

පොදුවේ ගත් කල, අපේ වගාකරුවන් අවධානය යොමු කරන්නේ පොල් සිටුවීමට පමණි. පොල් අස්වැන්න උපරිම මට්ටමට ළඟා වන තෙක් නැවත සිටුවීම, නඩත්තු කිරීම, සිටුවීම හා අන්තර් වගාවන් පිළිබඳව වගාකරුවන් ප්‍රවර්ධනය කිරීම හා දැනුවත් කිරීම කළ හැකිය. එසේ කිරීමෙන් කර්මාන්තයට වැඩි වගාකරුවන් ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට හැකි වනු ඇත.

ඵලදායිතාව අඩු වීමට විශාලතම හේතුවක් වන්නේ පාංශු පෝෂණය කෙරෙහි නිසි අවධානයක් නොදැක්වීම සහ පාංශු ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමයි. තරඟකාරී රටවලට සමගාමීව ඉඩම් ඵදායිතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පොහොර මාත්‍රාව සහ නිසි වාරිමාර්ග ක්‍රම භාවිතා කිරීමට වගාකරුවන් දිරිමත් කිරීම අවශ්‍ය වේ.

වෘත්තීය පොල් වැවිලිකරුවන්ගේ හිඟයක් පවතී. වෘත්තීය වැවිලිකරුවන් අවම වශයෙන් මධ්‍යම හා මහා පරිමාණ පොල් වතු කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ.

<u>යටිතල පහසුකම් සංවර්ධනය</u>

වාරිමාර්ග, වැසි ජලය එක්රැස් කිරීම වැනි ප්‍රදේශවල සංවර්ධනය කැපී පෙනේ. විශේෂයෙන් පොල් වගා කරන සමහර ප්‍රදේශවල කාලගුණික තත්ත්වයන්හි සැලකිය යුතු උච්චාවචනයන් සහ දිගු නියඟ කාලයන් හේතුවෙන් එම ප්‍රදේශවල අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

රජයේ නිලධාරීන් හරහා පොල් වගාව සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන සහයෝගය ප්‍රමාණවත් නොවන අතර මුළු දිවයිනම ආවරණය නොවේ. වගාකරුවන් අතර නව තාක්ෂණයන්, ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද සහ නව යටිතල පහසුකම් ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොතිබීටම එයට එක් හේතුවකි.

### ආ. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

මේ යටතේ අවධානය යොමු කළ යුතු අංශ පහක් ඇත

i. තාක්ෂණය හා පර්යේෂණ හා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම
ii. නියාමන රාමුව සහ බලධාරීන්ගේ මැදිහත්වීම
iii. අමුද්‍රව්‍ය සහ යෙදවුම් කළමනාකරණය
iv. අගය එකතු කළ හා ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම
v. දැනුවත්භාවය වැඩි දියුණු කිරීම

<u>තාක්ෂණය, පර්යේෂණ සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම</u>

කර්මාන්තයේ ඇති ප්‍රධානතම කරුණක් වන්නේ ශ්‍රමය ලබා ගැනීමේ හැකියාවයි. ස්වයංක්‍රියකරණය සහ තාක්ෂණය වෙනස් කිරීම තුළින් මිනිස්බල සම්බන්ධතාවය අඩු කර ගත හැකිය. රටේ යන්ත්‍ර සූත්‍ර ස්වයංක්‍රයව හෝ තාක්ෂණිකව වැඩිදියුණු කිරීමට කිසිදු උත්සාහයක් හා සාන්දණයක් ලබා දී නොමැත. නව තාක්ෂණය වැඩිදියුණු කිරීම් සහ ස්වයං පාලනය දේශීයකරණය කළ හැකි සහ දැරිය හැකි මිලකට කළ යුතුය.

<u>නියාමන රාමුව සහ බලධාරීන්ගේ මැදිහත්වීම</u>

රට තුළ පවතින නීති සහ නියාමන රාමු වැඩ කර්මාන්තය ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට තරම් ශක්තිමත් නොවේ.

කර්මාන්තයට ඇති ලොකුම තර්ජනය වන්නේ ඉඩම් කැබලි කිරීම සහ දේශීය භාවිතය සඳහා පොල් ගස් කැපීමයි. නාගරීකරණය වේගවත් කිරීම නිසා ඉඩම් හා පොල් දැව සඳහා ඉල්ලුමක් පවතින බව තේරුම්ගත හැකි නමුත් කර්මාන්තයට බලපෑමක් නොවන අයුරින් දැඩි හා නිසි රෙගුලාසි, පාලනයන් සහ කළමනාකරණය තිබිය යුතුය.

පහසුවෙන් ප්‍රවර්ධනය කළ හැකි එක් අංශයක් වන්නේ පොල් වගාව ගෘහ ගෙවතු වගාවක් ලෙස දිරිමත් කිරීම සහ පොල් පරිභෝජනය සම්බන්ධයෙන් ස්වයංපෝෂිතවීම පිළිබඳව පවුල් දැනුවත් කිරීමයි. එමගින් දේශීය පොල් ඉල්ලුම අවම වන අතර, අපනයනය සඳහා පවතින පොල් සැපයුම වැඩි කරනු ඇත.

කුඩා වගාකරුවන් නියෝජනය කරන කර්මාන්තයෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් මෙම අංශය ආරක්ෂා කිරීම සඳහා අනුබද්ධිත සහ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. එසේ නොවේ නම්, එය පොල් සැපයුමට බරපතල සෘණාත්මක බලපෑම් ඇති කරනු ඇත.

ආනයන හා අපනයන බදු සහ තීරුබදු සහ මිල පාලනයන් සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම අවශ්‍ය වේ. රජය සහ අමාත්‍යාංශය අවධානය යොමු කළ යුත්තේ විදේශයන් හි ප්‍රවර්ධනය කිරීම හා ආකර්ෂණය කර ගැනීම කෙරෙහි ය.

පොල් කර්මාන්තය ආයෝජකයින් එය කර්මාන්තයේ ධාරිතාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ලබන අතර නව තාක්ෂණයන්, යන්ත්‍රෝපකරණ සහ දැනුම රටට ගෙන ඒම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

කොහු කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර පොල් ලෙලි සැපයීම හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

<u>අමුද්‍රව්‍ය සහ යෙදවුම් කළමනාකරණය</u>

අඛණ්ඩ හා ගුණාත්මක අමුද්‍රව්‍ය නොමැතිව කිසිදු නිෂ්පාදන කර්මාන්තයක් සාර්ථක නොවේ. රට තුළ අමුද්‍රව්‍ය සැපයීම ප්‍රමාණවත් නොවන අතර වටිනාකම් දාමයේ අනෙකුත් කාර්යයන් හා කොටස් සමග නිසි ලෙස සම්බන්ධ නොවේ.
ප්‍රාථමික නිෂ්පාදන අපනයනය කිරීම කර්මාන්තයේ අමුද්‍රව්‍ය හිඟයට විශාලතම හේතුවකි.

<u>අගය එකතු කළ හා ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම</u>

සාම්ප්‍රදායික ප්‍රාථමික නිෂ්පාදන අඛණ්ඩව අපනයනය කිරීම අපනයන ප්‍රමාණය වැඩි කිරීම පමණක් නොව අපනයන ආදායම වැඩි කිරීම සඳහා කර්මාන්තයේ සියලුම අංශ හරහා අගය එකතු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම හා ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ.

කර්මාන්තයේ අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සහ නිෂ්පාදන පිළිබඳ දැනුවත්භාවය හා දැනුම නොමැතිකම මේ සඳහා එක් ප්‍රධාන හේතුවක් වන අතර අගය එකතු කිරීමට සහාය වන තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ කර්මාන්තය තුළ නොපවතී.

කර්මාන්තයේ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් රජය විසින් සංකේන්ද්‍රිත බහුවිධ වැඩසටහන් පැවැත්විය යුතුය.

දැනුවත්භාවය වැඩි දියුණු කිරීම

තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඕනෑම කර්මාන්තයක සංවර්ධනයට දායක වන තීරණාත්මක අංගයකි. පාරිභෝගිකයින් ඇතුළු කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් තොරතුරු ලබා දීම අත්‍යවශ්‍ය වේ.

මෙම ඉලක්කය සඳහා සලකා බැලිය යුතු නිර්නායකවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

| | මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
|---|---|
| **2.01** | නිසි පර්යේෂණ තුළින් කර්මාන්තයට බලපාන හානිකර පළිබෝධ සහ රෝග පිළිබඳ නාමාවලියක් සැකසීම (ප්‍රදේශය, හානිකර පළිබෝධ වර්ගය, හානිකර රෝග වර්ගය, කලාපය අනුව මුළු ගස් සංඛ්‍යාව, බලපෑමට ලක් වූ ගස් සංඛ්‍යාව, කලාපය අනුව හෙක්ටයාර, කලාපයෙන් බලපෑමට ලක් වූ හෙක්ටයාර) |
| **2.02** | 1.01 හි හඳුනාගෙන ඇති ගැටළු මඟහරවා ගැනීම සඳහා වෙනත් රටවල් විසින් අනුගමනය කරනු ලබන විසඳුම්, ක්‍රම සහ යාන්ත්‍රණයන් පිළිබඳ සවිස්තරාත්මක පර්යේෂණ / අධ්‍යයනයක් පැවැත්වීම. |
| **2.03** | 1.01 සහ 1.02 හි යෝජනා කර ඇති ඉහත අධ්‍යයන දෙක මත පදනම්ව ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ඇති අඩු පාඩු තේරුම් ගැනීම |
| **2.04** | 2.3 හි පරතර විශ්ලේෂණයේ දක්වා ඇති පරතරයන් පියවා ගැනීම සඳහා පැහැදිලි කාලරාමු, වගකීම් සහ වගවීම් සහිත, කෙටි කාලීන (වසර 1 ට අඩු), මධ්‍ය කාලීන (අවුරුදු 1 -3) සහ දිගු කාලීන (අවුරුදු 3 - 5) උපායමාර්ගික සැලසුම් යෝජනා කිරීම |
| **2.05** | නේවාසික කටයුතු සඳහා පොල් ඉඩම් මහා පරිමාණයෙන් යොදවා ගැනීම වැලැක්වීමට අදාළ නීති රීති දැඩි කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම. මෙය ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සහ ඉඩම් හුවමාරු ප්‍රතිපත්ති තුළින් ආවරණය විය යුතුය |
| **2.06** | නිශ්චිත කාල රාමුවක් තුළ ඒ ඒ කලාපයේ ඉලක්ක කෙරෙන ගස් ගණනක් වගා කරගැනීමට, ගෙවතු තුළ පොල් වගා කිරීම දිරිගැන්වීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කිරීම |
| **2.07** | උතුරු හා නැගෙනහිර පළාත් වල පොල් වගා කිරීම ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහනක් දියත් කිරීම ( පැහැදිලි කාල රාමුවක් වගකිම් සහ වගවීම් හා කළාපය අනුව ඉලක්ක ගත ගස් ගණනක් සහිත) |
| **2.08** | නැවත සිටුවීම, පුරප්පාඩු පිරවීම, පොල් ගස් අවට භූමි වගාකිරීම, අන්තර් භූමි සැකසීම සඳහා පැහැදිලි කාල රාමු වගකිම් සහ වලවීම් සහ කලාපය අනුව ඉලක්ක ගත සැළැස්මක් ඉදිරිපත් කිරීම. |
| **2.09** | භාවිතයට නොගත් රජයේ ඉඩම් කර්මාන්තයේ පාර්ශවකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වාර්ෂිකව නිදහස් කිරීමේ ඉලක්කයක් සහිතව පෞද්ගලික අංශයට බදු දීම සඳහා සවිස්තර සැලැස්මක් සැකසීම |
| **2.10** | රජයේ ඉඩම් බදු ක්‍රමයට ලබාගන්නා පෞද්ගලික වගාකරුවන් හට සම්මත මධ්‍යස්ථ සැලැස්මක් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) හඳුන්වා දී ඒ අනුව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. |

| | |
|---|---|
| **2.11** | වගාකරුවන් පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>• නාස්තිය අවම කිරීම<br>• පාංශු පෝෂ්‍ය පදාර්ථ ආරක්ෂා කිරීම<br>• පාංශු ගුණාත්මකභාවය වැඩි කිරීම<br>• පොහොර භාවිතය සහ කළමනාකරණය<br>• වාරිමාර්ග ක්‍රම<br>• වැසි ජලය එක්රැස් කිරීමේ හා ගබඩා කිරීමේ පද්ධති<br>• යෙදවුම් / අමුද්‍රව්‍ය හා අවසාන නිෂ්පාදනයේ නාස්තිය අවම කිරීම<br>• පාංශු තෙතමනය සංරක්ෂණ ක්‍රම<br>පැහැදිලි කාල රාමුවක්, වගකීම් සහ වගවීම සහ කලාපය අනුව ඉලක්ක සහිතව මුළු දිවයිනම ආවරණය වන පිරිදි නිසි පුහුණු කාළ සටහනක් සැකසීම. |
| **2.12** | ජාතික වෘත්තීය පුහුණු ආයතනයක් සමඟ හවුල්ව NVQ මට්ටමේ සහතිකයක් ලබාදෙන වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාවක් සහ උපාධියක් දියත් කිරීම. මෙම වැඩසටහන හරහා විවිධ මට්ටමින් සහතික කරන සුදුසුකම් ලත් වෘත්තීය වැවිලිකරුවන්ගේ ඉලක්කයක් සහිත සැලැස්මක් සකස් කිරීම. මෙම වැඩසටහන් ජාතික වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම වෘත්තීය ආයතන ඔස්සේ හඳුන්වා දීම |
| **2.13** | දිවයිනේ හෙක්ටයාර් ගණන අනුව ප්‍රදේශයකට එක් පොල් සංවර්ධන නිලධාරියෙකු බැගින් පත්කිරීම.<br>මේ සඳහා පැහැදිලි කාලරාමුවක්, වගකීම් සහ වගවීම සහ කලාපය අනුව ඉලක්කය සහිත සැලැස්මක් ඉදිරිපත් කිරීම |
| **2.14** | පුද්ගලික වාරිමාර්ග පද්ධති, වැසි ජලය එක්රැස් කිරීම සහ ගබඩා පද්ධති සඳහා ආයෝජනයන් සඳහා අඩු පොලී ණය ක්‍රමයක් හඳුන්වා දීම |
| **2.15** | පහත සඳහන් ප්‍රදේශ තුළ අමාත්‍යතුමාගේ අධීක්ෂණය යටතේ නවෝත්පාදන හා ස්වයං පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම<br>• වගා ක්‍රම සහ ක්‍රියාවලියන් තාක්ෂණික වශයෙන් වැඩිදියුණු කිරීම<br>• යන්ත්‍ර ස්වයංක්‍රීයකරණය සහ වැඩිදියුණු කිරීම<br>• වාරිමාර්ග ක්‍රම<br>(අවශ්‍ය නම් වෙනත් කාරණා එකතු කිරීමට හැකිය)<br>මෙම ඒකකය පැහැදිලි කාලරාමුවක්, වගකීම් සහ වගවීම සහ ප්‍රදේශය අනුව ප්‍රක්ෂේපිත වැඩිදියුණු කිරීමේ ඉලක්ක සහිත සැලැස්මක් ඉදිරිපත් කල යුතුවේ. |
| **2.16** | රජය සහාය දක්වන අඩු පොලී ණය ක්‍රමයක් කුඩා පරිමාණ වගාකරුවන් සඳහා හඳුන්වා දීම. ණය ලබා ගන්නා කුඩා වගාකරුවන් සඳහා සම්මත ක්‍රමික සැලැස්මක් සහ සම්මත මෙහෙයුම් ක්‍රමවේදයන් (SOP) හඳුන්වා දීම සහ ඒ තුළින් ඔවුන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. |

| | |
|---|---|
| **2.17** | නිසි ප්‍රමිතියකින් හා සුදුසු මිළ ගණන් යටතේ අපනයන සිදුකිරීම සඳහා ඵලදායි, කාර්‍යක්‍ෂම අපනයන පාලන රෙගුලාසි හා බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම |
| **2.18** | විදේශිය තත්ත්වයන් යටතේ හා දේශිය සැපයුම් උච්චා වචනයන් සැළකිල්ලට ගනිමින් නම්‍යශිලි ආනයන බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම |
| **2.19** | මිලකරණය සඳහා පිළිගත් සූත්‍රයක් හඳුන්වා දීම<br>• වගාකරුවන් සඳහා  මිළදී ගැනීමේ අවම මිලක්<br>• දේශීය පාරිභෝගිකයන් සඳහා උපරිම  මිලක් |
| **2'20** | දේශීය ව්‍යවසාකයන් සහ සාම්ප්‍රදායික  කර්මාන්තය ආරක්ෂා කරගනිමින් සහ බලගන්වමින් විදේශ ආයෝජන දිරිමත් කලයුතුය. මෙහිදී යෝජිත ඒකාබද්ද පොල්කර්මාන්ත වාණිජ මණ්ඩලයේ එකඟතාවය සහ සහයෝගය දේශීය සහ විදේශීය ආයෝජන සඳහා ලබා ගත යුතුය. කෙසේවෙතත් සැමවිටම වැඩි හිමිකම දේශීය ආයෝජකයන් සතු විය යුතුය. |
| **2.21** | කොහුබත් / සක්‍රිය (active) කාබන් කර්මාන්තයන්ට පොල් ලෙලි සහ කටු ලබා ගැනීම පහසු කරවීමට  නිසි ප්‍රතිපත්ති හඳුන්වා දීමට පැහැදිලි කාලරාමු, වගකීම් සහ වගවීම සහ ඉලක්කය සහිත සැලැස්මක් සැකසීම |
| **2.22** | සෑම පළාත් පාලන ප්‍රදේශයකම පොදු සහ සම්මත ව්‍යවස්ථාවක්, අරමුණු සහ ක්‍රියා පටිපාටියක් සහිත පොල් වගාකරුවන්ගේ සංගම් පිහිටුවීම. අරමුදල් සහ වෙනත් ආධාර සම්බන්ධයෙන් මෙම සමාජයට අමාත්‍යාංශයේ සහාය තිබිය යුතුය. ප්‍රදේශයේ පොල් සංවර්ධන නිලධාරියාගේ සහභාගීත්වයෙන් මාසික රැස්වීම් පැවැත්විය යුතුය. |
| **2'23** | 2020 වන විට පොල් මිලියන 3,600 ක ඉලක්කයක් කරා ළඟා වීමට සහ වාර්ෂික 2.5% ක වර්ධනයක් වේගයක් පවත්වා ගැනීමට සැලැස්මක් ගොඩනැගීම. |
| **2.24** | අමුද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම සඳහා බදු සහ තීරුබදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම. |
| **2.25** | අමුද්‍රව්‍ය අපනයනය කිරීම අධෛර්ය කිරීම සඳහා අපනයන බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම. |
| **2.26** | අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහා බදු සහන  හඳුන්වා දීම. |
| **2.27** | නිෂ්පාදනයන්හි  අවකලනය සහ අගය එකතු කිරීම් දිරිගැන්වීම සඳහා අඩු පොලී ණය ක්‍රම බදු ප්‍රතිලාභ සහ ණය ලබා දීම. එසේ අඩු පොලී ණය ක්‍රම, බදු ප්‍රතිලාභ සහ ණය ලබා ගන්නා ආයෝජකයින් සඳහා සම්මත සැලැස්මක් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටික් (SOP)හඳුන්වා දී ඒ තුළින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. |
| **2.28** | පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ගෘහස්ථ පරිභෝජනය උපරිම කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම. |

| | |
|---|---|
| | • නිපදවන පොල් හා පොල් තෙල් තුළින් උපරිම ප්‍රයෝජනය ලබාගැනීම<br>• අපතේ යාම අවම කිරීම සහ නැවත භාවිතා කරන ක්‍රම හඳුන්වාදීම<br>• විකල්ප නිෂ්පාදන සහ ඒවා භාවිතා කිරීමේ ක්‍රම සහ හැකියාවන් පිළිබඳ දැනුවත්භාවය. |
| **2.29** | වසර 5 ක් තුළ ගසක අස්වැන්න පොල් 100 දක්වා වැඩි කරන සැලැස්මක් සැකසීම |
| **2.30** | 2022 වන විට පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 1.4 දක්වා වැඩි කිරීම<br>ජාතික අපනයන ක්‍රමෝපාය හා හවුල්ව සැලැස්මක් ඉදිරිපත් කිරීම |

**අරමුණු 3. විවිධාංගීකරණය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන් හට නිසි ලෙස සැලසුම් කිරීමට හැකිවන පරිදි වෙළඳපල ගුණාත්මකභාවය, නිෂ්පාදනය සහ ව්‍යාපාර ශක්‍යතාවය පිළිබඳ තොරතුරු අඛණ්ඩව සැපයීමේ හැකියාව දියුණු කිරීම .**

උපාය මාර්ගය සකස් කිරීමේදී සහ තීරණ ගැනීමේදී ඇති ලොකුම බාධාවක් වන්නේ නිසි තොරතුරු නොමැතිකමවේ.

කර්මාන්තය පිළිබඳ ගුණාත්මක තොරතුරු ලබා ගත නොහැකි අතර අලෙවිකරණ නියෝජිතයින්ගේ සිට නිෂ්පාදකයින් දක්වාද නිෂ්පාදකයින්ගේ සිට වෙළඳුන්, සකසන්නන් සහ අවසන් පාරිභෝගිකයින් දක්වාද නිසි තොරතුරු බෙදා හැරීමක් නොමැත.

මේ හේතුවෙන් ක්ෂේත්‍රය පුරාවට එහි මෙහෙයුම් හා උපායමාර්ග නිසි කාල සීමාවන්ට අනුකූලව අර්ථවත් ලෙස සැලසුම් කිරීමට නොහැකි වී ඇත.
මෙම උපායමාර්ගය යටතේ ප්‍රධාන අංශ දෙකක් තිබේ

**අ)** වෙළඳපොළ පිළිබඳ බුද්ධි තොරතුරු

**ආ)** තොරතුරු බෙදා හැරීම වැඩි දියුණු කිරීම

**වෙළඳපල බුද්ධි තොරතුරු**

කෙටිකාලිනව වෙළඳපල සහ නිෂ්පාදන තොරතුරු ලබාගැනීමේ හැකියාව ගොඩනැගීම මගින් ක්ෂේත්‍රයේ ආදායම ඉහළ නැංවීමට මග සැලසෙනු ඇති අතර, දිගු කාලීනව එතුළින් ක්ෂේත්‍රයේ සැලසුම්කරණය සහ විකල්ප සංවර්ධන අවස්ථාවන් හඳුනා ගැනීම සඳහා පදනම වනු ඇත.

මෙම උපාය මාර්ගයේ කොටසක් ලෙස කාර්යක්ෂම වෙළඳපල තොරතුරු සේවාවක් පිහිටුවීම සහ අනාගත ගැනුම්කරුවන් නිෂ්පාදකයින් සහ සකසනයන් ඒ හා සමග සම්බන්ධ කිරීම අවශ්‍ය වේ. මෙය පවත්නා හෝ අනාගත වෙළඳපල අවස්ථා පිළිබඳ තොරතුරු සපයනු ඇති අතර මෙම තොරතුරු නිෂ්පාදනය කළ යුත්තේ කුමන නිෂ්පාදනද, එය නිෂ්පාදනය කරන්නේ කවුරුන්ද, කොපමණ නිපද විය යුතුද යන්න තීරණය කිරීමට උපකාරී වනු ඇත.

**තොරතුරු බෙදා හැරීම වැඩි දියුණු කිරීම**

මෙම උපාය මාර්ගයේ සාර්ථකත්වය සඳහා කාලෝචිත හා නිවැරදි තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය වන අතර ඒ මගින් ක්ෂේත්‍රය පුරා පුළුල් සම්බන්ධීකරණයක් සහ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවක් ගොඩනැගීමට හැකියාව සැලසෙනු ඇත.

උපාය මාර්ග දැනුවත්භාවය සහ අංශයේ විභවය පිළිබඳ තොරතුරු ලබා ගැනීම පහසු කිරීම, පුද්ගලික අංශයේ ආයෝජන වැඩි කිරීමට රුකුලක් වනු ඇත.

තවද ගුණාත්මක හා කාලෝචිත තොරතුරු ලබා ගත හැකි වූ විට එය අංශ විවිධාංගීකරණය හා සංවර්ධනය සැලසුම් කිරීමට පාර්ශවකරුවන්ට සඳහා ඵලදායී ලෙස යොදා හැකි වේ.

පළමු පියවර ලෙස දිවයින පුරා සමීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය වේ. ප්‍රාථමික සමීක්ෂණය මගින් පහත තොරතුරු රැස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- පොල් ඵලදායිතාව - හෙක්ටයාරයකට ටොන්
- වගාකරුවන්ගේ වයස
- වගාකරුවන්ගේ විධිමත් අධ්‍යාපනය
- වගාකරුවන්ගේ අත්දැකීම්
- වගාකරුගේ පවුලේ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව
- හෙක්ටයාරයකට ගස් ගණන
- වසරකට, එක් වගාකරුවෙකුට පොල් නිෂ්පාදනය
- වසරකට කොප්රා නිෂ්පාදනය - (කි.ග්‍රෑ / හෙක්ටයාරයකට).
- හෙක්ටයාරයකට ස්ථාවර පිරිවැය
- හෙක්ටයාරයකට විචල්‍ය පිරිවැය
- කාණ්ඩය අනුව අපනයන ආදායම

අගය එකතු කළ නිෂ්පාදනවල ප්‍රමාණය හා වර්ධනය

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | මිනුම් / ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
|---|---|
| **3.01** | දිවයින පුරා පර්යේෂණ සිදු කර පහත තොරතුරු රැස් කිරීම<br>• පොල් ඵලදායිතාව - හෙක්ටයාරයකට ටොන්<br>• වගාකරුවන්ගේ වයස<br>• වගාකරුවන්ගේ විධිමත් අධ්‍යාපනය<br>• වගාකරුවන්ගේ අත්දැකීම්<br>• වගාකරුගේ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව<br>• හෙක්ටයාරයකට පොල් ගස් ගණන<br>• එක් එක් වගාකරුවන්ගේ වාර්ෂික පොල් නිෂ්පාදනය<br>• වසරකට කොප්රා නිෂ්පාදනය<br>• හෙක්ටයාරයකට ස්ථාවර පිරිවැය<br>• හෙක්ටයාරයකට විචල්‍ය පිරිවැය<br>• එක් එක් අංශයේ අපනයන ආදායම<br>• අගය එකතු කළ නිෂ්පාදනවල ප්‍රමාණය හා වර්ධනය |
| **3.02** | ඉහත දත්ත වාර්ෂිකව යාවත්කාලීන කිරීම |
| **3.03** | ඉහත දත්ත සහ වර්තමාන තොරතුරු පිළිබඳව දේශීය පොල් සංවර්ධන නිලධාරීන් මාසිකව යාවත්කාලීන කිරීම සහ වගාකරුවන් හට අනෙකුත් පාර්ශවකරුවන් සමඟ තොරතුරු බෙදා ගැනීමට හැකියාව සැලසීම පිණිස ඔවුන්ට ඒ සඳහා භාවිතා කළ හැකි ටැබ් පරිසණක යන්ත්‍ර ලබා දීම |
| **3.04** | ඉහත ඇති සියලුම දත්ත සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම. වත්මන් දත්ත සමඟ වෙබ් අඩවිය නිතර යාවත්කාලීන කිරීම. |
| **3.05** | ඉහත තොරතුරු සහ වෙනත් වත්මන් තොරතුරු ඇති සියලුම පාර්ශවකරුවන්ට ප්‍රවේශ විය හැකි යෙදුමක් (ඇප්) දියත් කිරීම |
| **3.06** | මාසික ඊ-ප්‍රවෘත්ති සගරාවක් හඳුන්වා දී එය අදාළ සමාජිකයන් අතර බෙදා හැරීම |

| | |
|---|---|
| **3.07** | ඇමැතිවරයාගේ සහභාගීත්වයෙන් සියලුම පාර්ශවකරුවන් නියෝජනය කරන ක්‍රියාකාරී රැස්වීමක් පැවැත්වීම. සෑම පාර්ශවයකටම ඔවුන්ගේ වර්තමාන තත්ත්වය, මුහුණපාන ගැටළු සහ අනෙකුත් පාර්ශ්වයන්ගෙන් අවශ්‍ය උපකාරයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සහ ඒ සඳහා යෝග්‍ය ආකෘතියක් සහ වේලාවක් හඳුන්වා දීම |

## අරමුණු 4. රට තුළ පොල් එකතු කිරීම සහ සැපයීම ප්‍රවර්ධනය කරීම

i. උපාය මාර්ග 6 ක් ඇත
ii. ගොවි හා නිෂ්පාදක සංගම් පිහිටුවීම
iii. වැවිලිකරුවන් පුහුණුව
iv. ආදායම ඉහළ නැංවීම සඳහා නව්‍ය මිලකරණ
v. වගාකරුවන් සහ කර්මාන්තය පැහැදිලි ව්‍යුහගත රාමුවක් තුළ සංවිධානය කිරීම
vi. ගොවීන්ට තොරතුරු ලබාගැනීමට ඇති පහසුකම් ඇති කිරීම
vii. ගෘහස්ථ පොල් පරිභෝජනයේ අපතේ යාම් අවම කිරීම සඳහා දේශීය පාරිභෝගිකයින්ට වඩාත් ඵලදායි තිරසාර හුරුපුරුදු හඳුන්වාදීම

### i. <u>ගොවි හා නිෂ්පාදක සංගම් පිහිටුවීම</u>

කර්මාන්තයේ දියුණුව හා වැඩිදියුණු කිරීම සඳහා සාමුහිකව තීරණ ගැනීම සහ ද්විපාර්ශ්වික සන්නිවේදනය ඉතා වැදගත් වේ. වර්තමානයේ ක්ෂේත්‍රයේ ඉදිරි ගමන පිළිබඳ තීරණ ගැනීමේ හා උපාය මාර්ග සකස් කිරීමේදී කිරීමේදී බිම් මට්ටමේ පාර්ශවකරුවන් කෙරෙහි එතරම් අවධානයක් යොමු නොකෙරේ.

එමෙන්ම සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී ධනාත්මක හා සෘණාත්මක අත්දැකීම් යන දෙකම බෙදා ගැනීම ඉතා ක්ෂේත්‍රයට ප්‍රයෝජනවත් වේ. නමුත් අවාසනාවට අත්දැකීම් බෙදාහදා ගැනීමට දැනට වේදිකාවක් නොමැත.

### ii. <u>වැවිලිකරුවන් පුහුණුව</u>

වගාකරුවන්ට ප්‍රායෝගික හා තාක්ෂණික පුහුණුව ලබා දීම ඉතා වැදගත් වේ. පුහුණු ක්‍රම ඵලදායීතාව ඉහළ නැංවීම, නාස්තිය අවම කිරීම සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නිෂ්පාදක කුසලතා සහ නිපුණතා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

### iii. <u>ආදායම ඉහළ නැංවීම සඳහා නව්‍ය මිලකරණය</u>

වර්තමාන මිලකරණ යාන්ත්‍රණයේ විනිවිදභාවයක් නොමැති අතර අතරමැදියන්ගේ බලපෑමට ලක්වේ. සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ඵලදායී හා විනිවිදභාවය ඇති, තොග සහ නිෂ්පාදන ක්‍රියාවලියක් පිහිටීම, විශේෂයෙන් වගාකරුවන්හට ඉතා වැදගත් වේ.

### iv. <u>වගාකරුවන් සහ කර්මාන්තය පැහැදිලි ව්‍යුහගත රාමුවක් තුළ සංවිධානය කිරීම</u>

වගාකරුවන්ගේ වර්තමාන වතු නිෂ්පාදනය පුළුල් කිරීම හෝ පුනර්ජීවනය කිරීම සඳහා නිෂ්පාදන ආකෘතිය සහ වෙළඳපල ඉල්ලුම මත පදනම්ව වගාකරුවන් සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් වගාකරුවන්ට පවත්නා ඉඩම් වඩා හොඳින් භාවිතා කිරීමට සහ ඔවුන්ගේ නිෂ්පාදනය උපරිම තත්ත්වයකට ඉහළ නැංවීමට හැකි වන අතර සැපයුම්කරුවන්ගේ හිඟතාවයන්ද විසඳා ගත හැකි වනු ඇත.

වගාකරුවන් නිසි ලෙස සංවිධානය වී නිසි අයුරින් කටයුතු කළමනාකරණය කරන විට රජයට සහ තීරණ ගන්නන්ට බලපෑම් කණ්ඩායම් තුළින් ප්‍රබල බලපෑම් කිරීමෙන් කර්මාන්තයට ධනාත්මක වෙනස්කම් හා බලපෑම් ඇති කළ හැකිය.

කර්මාන්තයේ විවිධ උප අංශවල සංගම් පිළිවෙලට සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් තිබිය යුතුය. මෙය කර්මාන්තය එක්සත් කරන අතර කර්මාන්තයේ සියලු කොටස අතර නිසි සම්බන්ධීකරණයක් ඇති කරනු ඇත.

ගොවීන් / වගාකරුවන් පිළිබඳ අර්ථ දැක්වීම නැවත පරික්ෂා කල යුතුය. පොල් වගා කරුවන් ලෙස වාණිජමය මෙහෙයුමක් / ව්‍යාපාරයක් ලෙස කටයුතු කිරීමට පොල් වගා කරන්නන් පමණක් සලකන්නේ නම්, ගෙවතු වගා කරන්නන් කෙරෙහි අවධානය යොමු නොවනු ඇත. එවිට එම අංශය නොසලකා හරිනු ඇති අතර ගෙවතු වගාකරුවන් ආරක්ෂා කිරීමට හා සංවර්ධනය කිරීමට කිසිදු අවධානයක් හෝ උපාය මාර්ගයක් නොතිබෙනු ඇත.

### v. වගාකරුවන්ට තොරතුරු ලබාගැනීමේ පහසුකම් ඇති කිරීම

නිෂ්පාදන කටයුතු පිළිබඳ තොරතුරු වල නිරවද්‍යතාවය සහ ආවරණය වැඩි දියුණු කිරීම සඳහා සැපයුම් කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ සහ තොරතුරු වැඩසටහන් දියත්කිරීමට ආයෝජනය කළ යුතුය. මෙමඟින් වගාකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන වඩා හොඳින් සැලසුම් කිරීමට සහ විශේෂයෙන් වෙළඳපල ඉල්ලුම සපුරාලීමට සහ විවිධාංගීකරණය හා අගය එකතු කළ නිෂ්පාදන වෙත යාමට හැකි වේ.

කර්මාන්තයේ විශේෂ අවශ්‍යතාතා පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සහ අලෙවිකරණ කටයුතු කිරීම සඳහා අරමුදලක් අවශ්‍ය වේ. (රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය විසින් නිර්මාණය කර නඩත්තු කරනු ලබන

### vi. ගෘහස්ථ පොල් පරිභෝජනයේ අපතේ යාම් අවම කිරීම සඳහා දේශීය පාරිභෝගිකයින්ට වඩාත් ඵලදායී / තිරසාර පරිභෝජන පුරුදු හඳුන්වා දීම.

දැනුවත්භාවය නොමැතිකම හේතුවෙන් ගෘහස්ථ පරිභෝජනය තුළ සිදුවන අපතේ යාම හේතුකොටගෙන අපනයණය කල හැකි මුළු ප්‍රමාණය අපතේ යන බැවින් පොල් කර්මාන්තයෙන් උපයා හැකි අපනයන ආදායමට අහිතකර ලෙස බලපායි.

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | මිනුම් / ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
|---|---|
| **4.01** | පහත සඳහන් සංගම්වල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් පොල් කර්මාන්තකරුවන්ගේ එකාබද්ධ වාණිජ මණ්ඩලය ඇති කළ යුතුය<br>• ශ්‍රී ලංකා පොල් වගාකරුවන්ගේ සංගමය<br>• ලංකා දිසිදි පොල් කම්කරුවන්ගේ සංගමය<br>• පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය<br>• කොහු කර්මාන්ත හිමියන්ගේ සංගමය<br>• පොල් තෙල් කර්මාන්ත හිමියන්ගේ සංගමය<br>• කොහු නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය<br>• නැවුම් පොල් තෙල් අපනයනකරුවනගේ සංගමය |
| **4.02** | මුළු දිවයිනම ආවරණය වන පරිදි වාර්ෂික වැඩ සැළැස්මක් සමග පොල් සංවර්ධන සංගම් අතර නිවැරදි භාවිතයන් සහ අත්දැකීම් හුවමාරු ක්‍රම පිළිබඳ දැනුම බෙදා ගැනීමේ සැසි සංවිධානය කිරීම. |
| **4.03** | අමාත්‍යාංශයේ පර්යේෂණ, නවෝත්පාදන හා ස්වයං පාලක අංශය යටතේ නව තාක්ෂණය, යන්ත්‍ර, ක්‍රියාවලි, පොහොර, වාරිමාර්ග පද්ධතිය ආදිය ප්‍රදර්ශනය කිරීම සඳහා ආදර්ශ මධ්‍යස්ථානයක් පිහිටුවීම. සෑම පළාතක සහ දිස්ත්‍රික්කයකට එක් ආදර්ශ මධ්‍යස්ථානයක් තිබිය යුතුය. මෙම ආදර්ශ මධ්‍යස්ථාන වල වෙතින් ලබා ගත හැකි තොරතුරු කාර්තුවකට එක් වරක් යාවත්කාලීන කළ යුතුය. |

| | |
|---|---|
| **4.04** | නව තාක්ෂණය, ක්‍රමවේදයන් සහ ක්‍රියාවලීන් නව්‍යකරණය කිරීම දිරිගැන්වීම සඳහා දේශීය පොල් සංවර්ධන සංගම් අතර තරඟයක් සංවිධානය කිරීම. උදා.<br>• හොඳම ක්‍රියාවලි නව්‍යකරණය<br>• හොඳම ක්‍රම නවෝත්පාදනය<br>• හොඳම යන්ත්‍ර ස්වයංක්‍රීයකරණය<br>• හොඳම ක්‍රමික දියුණු කිරීමේ වැඩසටහන් |
| **4.05** | අමුද්‍රව්‍ය සහ අනෙකුත් යෙදවුම් මිලදී ගැනීම සඳහා රජය විසින් පාලනය කරනු ලබන යාන්ත්‍රණයක් හඳුන්වා දීම. මේ සඳහා රජය විසින් වී මිලදී ගැනීම සඳහා යොදා ගැනෙන යාන්ත්‍රණ ක්‍රමයට සමාන ක්‍රමයක් අනුගමනය කළ හැකිය. රජයේ මැදිහත්වීම තුළින් මිල උද්ධමනය සහ අමුද්‍රව්‍ය සැපයීම කළමනාකරණය කිරීම. |

**අරමුණු 05. පාර්ශවකරුවන් හට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයෝජනය කිරීමේ හැකියාව සැලසීම සඳහා මූල්‍ය යාන්ත්‍රණ සංවර්ධනය කිරීම**

මෙහි පරමාර්ථය නම්, මෙම අංශයේ දිගුකාලීන ආයෝජන ඌනථාවය නිසා හටගෙන ඇති අහිතකර ප්‍රතිඵල හඳුනා ගැනීම සහ නිසි සම්පත් යොදා නොගැනීමෙන් ඇති විය හැකි අවදානම් අවම කිරීමයි. මෙම පරමාර්ථය අරමුණු කරන්නේ උපායමාර්ගය ක්ෂණිකව හා කෙටිකාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් සුරක්ෂිත කිරීම සහ බල ගැන්වීම මෙන්ම විවිධාංගීකරණය වූ කර්මාන්තයක අඛණ්ඩ සංවර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සඳහා අවසර දීම සඳහා නව යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමයි.

මේ යටතේ අවධානය යොමු කළ යුතු අංශ 4 ක් ඇත.

1. මූල්‍ය හා සැපයුම් ඇගයීම් සිදු කිරීම
2. වාණිජමය වශයෙන් මෙහෙයවන සංගම් හරහා ගොවීන් හට සුදුසු මිල ගණන් සහ මූල්‍ය යාන්ත්‍රණ සලසා දීම.
3. කාරක ප්‍රාග්ධනය සහ සැකසුම් උපකරණ සඳහා මුදල් සැපයීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම
4. වටිනාකම් දාමයේ අතරමැදියන් විසින් ජනනය කරන අදෘශ්‍යමාන ලාභය පාලනය කිරීම

**1. මූල්‍ය හා සැපයුම් ඇගයීම් සිදු කිරීම**

සියලු අංශ වෙත විවිධ රාජ්‍ය ආයතනවල දිගුකාලීන ප්‍රතිපත්ති තීරණ තුළින් පොල් කර්මාන්තය තුළ ස්ථාවර ආයෝජන සංස්කෘතියක් හඳුන්වා දීම වැදගත් ය.
වටිනාකම් දාමය හරහා මූල්‍ය අවශ්‍යතා පිළිබඳ පූර්ණ දැනුමක් රජයට සහ මූල්‍ය ආයතනවලට ලබා දෙනු ඇත. එම ආයතනවලින් ප්‍රමාණවත් ආධාර ලබා ගත හැකි වනු ඇත. මෙමගින් ක්ෂේත්‍රයේ මූල්‍ය සැපයුම වැඩිදියුණු කිරීමට මග පාදනු ඇත.

**2. වාණිජමය වශයෙන් මෙහෙයවන සංගම් හරහා ගොවීන් හට සුදුසු මිල ගණන් සහ මූල්‍ය යාන්ත්‍රණ සලසා දීම**

මෙමගින් වගාකරුවන්ට / සංගම්වලට ඔවුන්ගේ මෙහෙයුම් පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසෙනු ඇත. එලෙසම මෙමගින් ස්ථාවර මිලක් වගාකරුවන්ට සහතික කිරීමෙන් ඔවුන්ට, අතරමැදියන්ගේ සූරා කෑමෙන් මිදීමට මග සලසනු ඇත.
මේ තුළින් කුඩා පරිමාණ වගාකරුවන්ගේ සහ අයිතිකරුවන්ගේ ආයෝජන හැකියාව ශක්තිමත් වනු ඇති අතර අපනයනකරුවන්ට ආයතනික හා මූල්‍ය පහසුකම් සපයාදීමට හැකි වනු ඇත.

**3. කාරක ප්‍රාග්ධනය සහ සැකසුම් උපකරණ සඳහා මුදල් සැපයීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම**

කර්මාන්තයේ ප්‍රධාන ගැටළුවක් වන්නේ කාරක ප්‍රාග්ධනය ලබා ගැනීමයි. සකසන්නන් සහ වගාකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමට, අලෙවිකරණයට සහ නිෂ්පාදන සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සහතික කර

දීම සඳහා කෙටි කාලීන කාරක ප්‍රාග්ධන මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ.
අකාර්යක්ෂම කාරක ප්‍රාග්ධන කළමනාකරණය යනු සකසනයන් සහ වගාකරුවන් කර්මාන්තයෙන් ඉවත් විමට බලපාන විශාලතම හේතුවකි. එබැවින් මූල්‍ය ආධාර සැපයීම වැදගත් වන නමුත් නිසි ලෙස කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ ව සකසනයන් සහ වගාකරුවන් දැනුවත් කිරීම වඩාත් වැදගත් වේ.

**4. වටිනාකම් දාමයේ අතරමැදියන් විසින් ජනනය කරන අදෘශ්‍යමාන ලාභය පාලනය කිරීම**

වටිනාකම් දාමයේ සෑම පියවරක හා අංගයකම අතරමැදියන් සිටින අතර බොහෝ අවස්ථාවන්හිදී මෙම ක්‍රියාදාමයන් පාලනය කරනු ලබන්නේ වගාකරුවන්, මෝල් හිමියන් වැනි කර්මාන්තයේ ඍජු පාර්ශවකරුවන් විසින් නොව එම අතරමැදියන් විසිනි. ලාභයේ වැඩි කොටසක් බෙදා ගන්නේද මෙම අතරමැදියන් විසින් වේ. එනම් වටිනාකම් දාමය හරහා ඉල්ලුම සහ සැපයුම් කළමනාකරණය තුළින් ඔවුන් මිලට ප්‍රබල බලපෑමක් ඇති කරයි.

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
|---|---|---|
| **5.01** | කර්මාන්තයේ සියලුම උප කාණ්ඩ සහ පාර්ශවකරුවන් ආවරණය වන පරිදි මිල සූත්‍රයක් හඳුන්වා දීම (උදා: අවම පොල් ගෙඩියක මිල සහ අවම ලෙලි ගහන ලද පොල් ගෙඩියක මිල). මෙය අමුද්‍රව්‍ය සඳහාද අදාළ විය යුතුය. මිලකරණ සූත්‍රය අමාත්‍යාංශය විසින් පාලනය කළ යුතුය. | |
| **5.02** | පොල් සහ ලෙලි ගහන ලද පොල් සඳහා උපරිම මිල පාලනය කෙරෙන යාන්ත්‍රණයක් හඳුන්වා දෙන්න. අමාත්‍යාංශය විසින් අවශ්‍ය පරිදි මෙම මිල තීරණය කරමින් ක්‍රියාවට නැංවිය යුතුය. | |
| **5.03** | කුඩා වගාකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොහොර සඳහා සහනාධාර ක්‍රමයක් හඳුන්වා දීම. | |
| **5.04** | නව ආයෝජන සඳහා කර්මාන්තයේ සියලු ම උප අංශ සහ පාර්ශ්ව කරුවන් සඳහා අඩු පොලී ණය ක්‍රමයක් හඳුන්වා දීම. ණය ලබා ගන්නා ආයෝජකයින් සඳහා සම්මත සැලැස්මක් සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි හඳුන්වා දීම තුළින් ප්‍රගතිය නිරීක්ෂණය කල යුතු වේ. | |
| **5.05** | දිවයිනේ සියලුම පාර්ශවකරුවන් ආවරණය වන පරිදි හොඳ ව්‍යාපාර කළමනාකරණ පිළිවෙත් පිලිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. කලාප අනුව ඉලක්ක කර ගනිමින් පැහැදිලි කාලසටහන්, වගකීම් සහ වගවීම සහිතව මුළු දිවයිනම ආවරණය කෙරෙන පුහුණු සැළැස්මක් සකස් කිරීම. | |

**අරමුණු 6: පොල් නිෂ්පාදන අගය එකතු කිරීම සහ විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පොල් සැකසුම් කර්මාන්තයක් සංවර්ධනය කිරීම**

කාර්යක්ෂමතාව, පිරිවැය සහ කුසලතා අවශ්‍යතා අනුව වඩාත් යෝග්‍ය තාක්ෂණය භාවිතා කිරීම සඳහා වටිනාකම් දාමයේ විවිධ මට්ටම්වල පාර්ශවකරුවන් යොමු කිරීම හා පෙළඹවීම වැදගත්ය. මේ තුළින් පොල් කර්මාන්තයේ සැකසුම් අදියර ව්‍යාප්ත කිරීමට හැකි වනු ඇත.

මේ යටතේ උපාය මාර්ග හතරක් ඇත..

a. අගය එකතු කිරීම සහ පොල් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන සැකසුම් කර්මාන්තය සංවර්ධනය කිරීම
b. මෝල් හිමියන්ට අඛණ්ඩ සැකසුම් ක්‍රම හඳුන්වා දෙන්න
c. තත්ත්ව පරීක්ෂණ සහ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම

d. පාම් ඔයිල් සහ අනෙකුත් එවැනි ද්‍රව්‍ය ආනයනය කිරීම හා එහි භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා තීරුබදු ක්‍රමයක් හඳුන්වා දීම

**<u>අගය එකතු කිරීම සහ පොල් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන සැකසුම් කර්මාන්තයක් සංවර්ධනය කිරීම</u>**

කර්මාන්තය සංවර්ධනය කිරීමේදී ඇති ලොකුම බාධාව නම් නිසි යන්ත්‍රෝපකරණ නොතිබීමයි. නිවැරදි ප්‍රමිතීන් හා තාක්ෂණයෙන් යුත් නිසි යන්ත්‍රෝපකරණ ලබා ගැනීම දිරි ගැන්වීම පිණිස එම යන්ත්‍ර ආනයනය සීමා කරන රෙගුලාසි සහ බදු අවම කිරීම අවශ්‍ය වේ.

**<u>මෝල් හිමියන්ට අඛණ්ඩ සැකසුම් ක්‍රම හඳුන්වා දීම</u>**

වියළන ලද පොල් මෝල් හිමියන් තම සම්පත් හා අමුද්‍රව්‍ය කාර්යක්ෂමව භාවිතා කිරීම උදෙසා කණ්ඩ නිෂ්පාදන ක්‍රමයෙන් බැහැරවී, අඛණ්ඩ නිෂ්පාදනය ක්‍රියාවලියක් දක්වා වෙනස් විය යුතුය.

**<u>තත්ත්ව පරික්ෂණ සහ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම</u>**

අපනයන සඳහා අපේක්ෂිත තත්ත්ව ප්‍රමිතීන් සහ අවශ්‍යතාවයන් අඛණ්ඩව ඉහළ යමින් පවතී.
එබැවින් ශ්‍රී ලංකා නිෂ්පාදන ගෝලීය පාරිභෝගිකයින්ට සහ වෙළඳපලවලට අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. ගුණාත්මක භාවය හා තත්ත්ව සහතික නිර්ණායක වැඩසටහනක් හඳුන්වා දීම මගින් නිෂ්පාදන නිරන්තර අධීක්ෂණයට සහ වැඩිදියුණු කිරීම් සඳහ පාත්‍ර කළ යුතු වේ.
කර්මාන්තයේ ගුණාත්මක ප්‍රමිතියක් සහ ව්‍යුහයක් වර්ධනය කිරීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

- කොහුබත් අංශය අපේක්ෂිත තත්ත්ව මට්ටමට වඩා බෙහෙවින් අඩු බැවින් ඉහළ ප්‍රමිතියකට වර්ධනය කළ යුතුය
- තන්තු වල සහ කොකෝ පීට් (coco peat) වල ගුණාත්මකභාවය එකවර වැඩි දියුණු කිරීමේ අරමුණින් වියළන බිම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමඃ
- ගෝලීය ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ආනයන සඳහා ෆයිටොසැනිටරි අවශ්‍යතා ඉල්ලා සිටින අතර එබැවින් පිරිසිදු නිෂ්පාදනය අතිශයින් වැදගත් වේ
- අනාගත පැවැත්ම පිණිස පොල්තෙල් කර්මාන්තය තවදුරටත් නියාමනය කළ යුතුය
- නිෂ්පාදන ක්‍රියාවලිය නියාමනය කිරීම.
- GMP" ISO වැනි ජාත්‍යන්තර සහතික ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- අපනයන නිෂ්පාදන සඳහා ගුණාත්මක ප්‍රමිතියක් සහ ක්‍රියාවලි ප්‍රමිතිකරණයක් හඳුන්වා දීම

**<u>පාම් ඔයිල් සහ අනෙකුත් එවැනි ද්‍රව්‍ය ආනයනය කිරීම හා එහි භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා තීරුබදු ක්‍රමයක් හඳුන්වා දීම</u>**

පාම් ඔයිල් සහ අනෙකුත් ද්‍රව්‍ය ආනයනය කිරීම සම්බන්ධව පවත්නා ප්‍රතිපත්ති, සීමාවන් සහ තීරුබදු ප්‍රමාණවත් සහ නම්‍යශීලී නොවන අතර දේශීය කර්මාන්තය සුරක්ෂිත නොකරයි. එබැවින් පවත්නා යාන්ත්‍රණය පිළිබඳව නැවත සොයා බැලීම අවශ්‍ය වේ.

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
|---|---|
| **6.01** | යන්ත්‍ර සූත්‍ර ආනයනය සඳහා වන තීරු බදු අඩු කිරීම සහ නව යන්ත්‍ර සූත්‍ර ආනයනය දිරිගැන්වීම සඳහා යන්ත්‍රෝපකරණ ආශ්‍රිත ආයෝජනයන් සඳහා බදු ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. |

| | |
|---|---|
| **6.02** | මුළු දිවයිනේම සියලුම පාර්ශවකරුවන් ආවරණය වන පරිදි නිවැරදි යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳ පුහුණුව ලබා දීම. පැහැදිලි කාල පරාසයන්, වගකීම් සහ වගවීම සහිත සහ මුළු දිවයිනම කලාප අනුව ඉලක්ක කරන නිසි පුහුණු වැඩ සටහනක් ඉදිරිපත් කරන්න. |
| **6.03** | අඛණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සමස්ත කලාපයේම අඛණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. පැහැදිලි කාල පරාසයන්, වගකීම් සහ වගවීම සහිත සහ මුළු දිවයිනම කලාප අනුව ඉලක්ක කරන නිසි පුහුණු වැඩ සටහනක් ඉදිරිපත් කරන්න. |
| **6.04** | තන්තු වල ගුණාත්මකභාවය සහ කොකෝ පීට් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් ෆයිබර් මෝල් සඳහා වියළන බිම් ව්‍යාපෘතියක් හඳුන්වා දීම. |
| **6.05** | අපනයනකරුවන්ට GMP, ISO සහතික ලබා ගැනීම අනිවාර්‍ය කරන්න |
| **6.06** | සියලුම අපනයනකරුවන් සඳහා ජාතික තත්ත්ව සම්මත සහතිකයක් නිකුත් කර වරින් වර සහතික කිරීම අලුත් කිරීම. එම සහතිකය නොමැතිව අපනයනය කිරීමට සුදුසුකම් ලබා නොදිය යුතුය. |
| **6.07** | පොල්තෙල් සිල්ලර වෙළඳාම සඳහා අනිවාර්ය බෝතල් කිරීම සහ ලේබල් කිරීම හඳුන්වා දීම, බෝතල් කිරීම සඳහා වාර්ෂිකව SLS සහතිකය ලබා ගැනීමද අනිවාර්ය කල යුතුය. එමෙන්ම සෞඛ්‍යාරක්ෂිත නොවන බහාලුම්වලින් තොග සහ සිල්ලර පොල්තෙල් විකිණීමේ වර්තමාන භාවිතයන් තහනම් කිරීම. |

**අරමුණු 7: විවිධ අංශයන්හි අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා උපකාරක සේවා වැඩි දියුණු කිරීම**

මෙම අරමුණ, පොල් ක්ෂේත්‍රයේ වටිනාකම් දාම ක්‍රියාවලියේ කොටස්කරුවන් හට බලපාන මෙහෙයුම් පරිසරයේ ප්‍රධාන අංග සහ ආධාරක සේවා ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කරයි. මේ යටතේ අවධානය යොමු කළ යුතු අංශ 2 ක් ඇත.

1. රජයේ සහය සහිතව පුද්ගලික අංශය විසින් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට, විවිධාංගීකරණය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ගන්නා උත්සාහයන් සඳහා සහය දැක්වීමට ප්‍රතිපත්ති සහ නියාමන රාමු වැඩ අනුකූලගත කිරීම.
2. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

**<u>රජයේ සහය සහිතව පුද්ගලික අංශය විසින් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට, විවිධාංගීකරණය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ගන්නා උත්සාහයන් සඳහා සහය දැක්වීමට ප්‍රතිපත්ති සහ නියාමන රාමු වැඩ අනුකූලගත කිරීම.</u>**

කර්මාන්තය තුල කර්මාන්තකරුගේ සහ රජයේ කාර්යභාරය පිළිබඳව නිසි අවබෝධයක් හෝ පැහැදිලි කිරීමක් නොමැත, මෙය සමකාලීන ව්‍යාපාරික යථාර්ථයන්ට අනුකූල වන ලෙස අර්ථ දැක්විය යුතු අතර කර්මාන්තයේ කර්තව්‍යයන් සහ පරිසරයන් අනුව අඛණ්ඩව යාවත්කාලීන කල යුතු වේ. නියාමකයෙකු ලෙස රජය විසින්

ඉටුකෙරෙන  කාර්යභාරය සැක සහිත ය.  රජය නියාමකයකුට වඩා පහසුකම් සපයන්නකුගේ සහ සම්පත් සපයන්නකුගේ කාර්යභාරය ඉටු කළ යුතුය.

රජයේ ආයතන අතර සම්බන්ධීකරණ බිඳ වැටීම් නිසා කර්මාන්තයේ සංවර්ධනය වේගයට අහිතකර බලපෑම් එල්ලවේ. සමහර විට කර්මාන්ත පාර්ශ්වකරුවන්ට විවිධ රාජ්‍ය ආයතනවලින් වෙනස් හා පරස්පර විරෝධී උපදෙස් ලැබේ. එබැවින් සියලුම රාජ්‍ය ආයතන සඳහා පොදු සහ හවුල් දැක්මක් සහ ඉලක්කයක් තිබීම ඉතා වැදගත් වේ.

ජාතික පොල් ප්‍රතිපත්තිය තනි පුද්ගලයකු විසින් මෙහෙයවනු ලබන හෝ මෙහෙයවන එකක් නොවිය යුතුය. පුද්ගලයන්, ඇමතිවරයා, සභාපතිවරයා සහ අනෙකුත් තීරණ ගන්නන් වෙනස් වුවද එකඟ වූ කාල සීමාවක් සඳහා වෙනස් නොවන ප්‍රතිපත්තියක් විය යුතුය. කර්මාන්තය පිළිබඳව තීරණ ගන්නා පුද්ගලයින්ට කර්මාන්තයේ අත්දැකීම් සහ දැනුම තිබිය යුතුය. මෙය ආරම්භ විය යුත්තේ අමාත්‍යාංශයේ සහ රජයේ ආයතනවල ජ්‍යෙෂ්ට තනතුරු වලිනි.

රාජ්‍ය අංශය / රාජ්‍ය ආයතන සහ කර්මාන්තයේ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් අතර සම්බන්ධතාවයන් යහපත් නොවේ. නිසි රාජ්‍ය-පෞද්ගලික සම්බන්ධීකරණ සම්බන්ධතාවයක් සහ හවුල්කාරිත්වයක් නොමැතිව මෙම කර්මාන්තය ඉදිරියට නොයනු ඇත.
කර්මාන්තය දිරිගැන්වීම සඳහා වර්තමාන නියාමන රාමු බඳු හා ප්‍රත්පත්ති පූර්ණ ඇගයීමකට ලක් කළ යුතු වේ.

## යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

නිසි යටිතල පහසුකම් නොමැතිව කිසිදු කර්මාන්තයක් සාර්ථක නොවේ.
කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ පාර්ශවයන්ට ඔවුන්ගේම යටිතල පහසුකම්, ගබඩා, ප්‍රවාහන ආදිය සඳහා ආයෝජනය කිරීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැති බැවින්වි මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

පවත්නා යටිතල පහසුකම් සංවර්ධන වැඩපිළිවෙත්, ඒවායේ වැදගත්කම සහ ඒවා ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම පිළිබඳ  ක්ෂේත්‍රය තුළ පවතින  දැනුම ප්‍රමාණවත් නොවේ. පවතින යටිතල පහසුකම් පිළිබඳවත් තමන්ගේම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රම පිළිබඳවත් පාර්ශවකරුවන් දැනුවත් කිරීමට කිසිදු උත්සාහයක් නොමැත.

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
|---|---|
| **7.01** | රජයේ ආයතන තුනේම සහභාගීත්වයෙන් පොල් සංවර්ධන පාලක මණ්ඩලයක් පිහිටුවීම සහ අමාත්‍යවරයාගේ  නායකත්වයෙන් ජාතික පොල් කවුන්සිලයක් ඇරඹීමට යෝජනා කිරීම.  මෙම කවුන්සිලය ප්‍රගතිය සමාලෝචනය කිරීමට සහ ඇගයීමට මසකට වරක් රැස්විය යුතුය. |
| **7.02** | වටිනාකම් දාමය හරහා යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන්  පැවැත්වීම. මුළු දිවයිනම ආවරණය වන පරිදි  පැහැදිලි කාලරාමු, වගකීම් සහ වගවීම සහ කලාපය අනුව ඉලක්ක කර ගනිමින් නිසි සැලැස්මක් ඉදිරිපත් කිරීම. |
| **7.03** | රට පුරා පවතින යටිතල පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම. මුළු දිවයිනම ආවරණය වන පරිදි  පැහැදිලි කාලරාමු, වගකීම් සහ වගවීම සහ කලාපය අනුව ඉලක්ක කර ගනිමින් නිසි සැලැස්මක් ඉදිරිපත් කිරීම. |

| | |
|---|---|
| **7.04** | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනයන් දිරිගැන්වීම සඳහා සහන කාලයක් සහිතව අඩු පොලී ණය පහසුකම් ලබා දීම. ණය ලබා ගන්නා ආයෝජකයින් සඳහා සම්මත සන්ධිස්ථාන සැලැස්මක් සහ සම්මත මෙහෙයුම් ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. |


**අරමුණු 8: පොල් අංශය කළමනාකරණය කිරීමට සුදුසු පරිපාලන හා නියාමන රාමු ඇති කිරීම සඳහා පොල් ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණ මණ්ඩලයක් පිහිටුවීම .**

පොල් කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීමේ අරමුණින් මෙම උසස් මණ්ඩලය ප්‍රධාන අමාත්‍යාංශ නිලධාරීන්, විද්වතුන් සහ පළාත් පොල් සංවර්ධන සංගම්වල නියෝජිතයින්ගෙන් සමන්විත විය යුතුය. මෙහිදී රජය සහ අමාත්‍යාංශ හුදෙක් පරිපාලක කාර්යභාරයකට වඩා පහසුකම් සපයන්නකුගේ කාර්යභාරය ඉටු කළ යුතුය.

**මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| | **මිනුම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක** |
|---|---|
| **8.01** | එක්බද්ධ පොල් කර්මාන්ත වාණිජ මණ්ඩලයක් පිහිටු වීම |

**<u>එකාබද්ධ පොල් කර්මාන්ත වාණිජ මණ්ඩලය</u>**




CCB - Coconut Cultivation Board
CRI - Coconut Research Institute
CDA - Coconut Development Authority

## එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලය (JCIC)

**මූලධර්ම හා අඟයන්**

අ. විනිවිදභාවය - සියලු තීරණ සහ හැසිරීම් විවෘතව සහ පොදුවේ පැවතිය යුතු අතර මහජන පරීක්ෂාවට පවා ලක්විය හැකි විය යුතුය

ආ. සාධාරණ ගනුදෙනු - පොල් කර්මාන්තයේ දියුණුව සඳහා යැයි අපේක්ෂාවෙන් තීරණ ගනු ලබන අතර එය යහපත් අපේක්ෂාවකින් කළ දෙයක් ලෙසට සාධාරණීකරණය කළ හැකි විය යුතුය.

ඇ. එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලයේ ස්ථාවරත්වය සහ කීර්තිය වැඩි දියුණු කිරීම - සෑම ක්‍රියාවන් සහ තීරණයන් තුළින් වාණිජ මණ්ඩලයේ කීර්තිය සහ පිළිගැනීම වැඩි දියුණු කිරීම ඉලක්කයක් විය යුතුය.

**දැක්ම**

ශ්‍රී ලාංකීය ජාතික ආදායමේ සැලකිය යුතු වර්ධනයක් මෙන්ම ජාතික සමගිය, එකමුතුබව, සමෘද්ධිය, සහ ආර්ථික සංවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් සලසන නවීකරණය කරන ලද පොල් කර්මාන්තයක් ගොඩනැගීම

**මෙහෙවර**

- නවීකරණය සහ ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ විවිධාංගීකරණ ක්‍රියාවලින් ඇති කිරීම සඳහා නායකත්වය, උපාය මාර්ගික අධීක්ෂණය සහ කළමනාකාරිත්වය සැපයීම
- ශ්‍රී ලංකා රජය සහ අනාගත කර්මාන්ත හවුල්කරුවන් වෙත පොල් කර්මාන්තය රැගෙන යාම.
- ඵලදායී අංශ පාලනයක් ස්ථාපිත කිරීමට සහය වීම පිණිස පාර්ශව කරුවන්ගෙන් බලාපොරොත්තු වන හැසිරීම් සහ වගකීම් ආකෘතියක් ගොඩ නැගීම

**අරමුණු**

- උපාය මාර්ග හා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය හා එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලයේ මෙහෙවර ඉටුකිරීම සඳහා අඛණ්ඩව සහය දැක්වීම
- කර්මාන්තයේ සංවර්ධනය සහ බාහිර සාධක සැලකිල්ලට ගනිමින් උපාය මාර්ග සංශෝධනය කිරීම සහ වෙනස් කිරීම.
- ප්‍රධාන පාර්ශව කරුවන් සමග උපායමාර්ගිකව ක්‍රියා කිරීම.

**එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලයේ කාර්යයන්**

- මෙම උපාය මාර්ගයේ දක්වා ඇති සැලසුම්ගත ක්‍රියාකාරකම් සාර්ථක කරගැනීමට පොල් අංශය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිම් දරයි.
- ග්‍රාමීය ප්‍රදේශවල පොල් වගාකරුවන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් සපුරාලීම සහතික කිරීම පිණිෂ තවාන්, ප්‍රාථමික නිෂ්පාදන උපදේශක කණ්ඩායම් වල පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම;
- අනුමත සැලසුම් කළ ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අරමුදල් අනුව වාර්ෂිකව පොල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- සෑම වසරකම රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ කාලය තුළ අමාත්‍යාංශයට වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම; ගාස්තු කාලසටහන් සංවර්ධනය කිරීම සහ සංවිධානයේ අඛණ්ඩ සංවර්ධනය උදෙසා සාමාජිකයින්ට සහ සාමාජිකයින් නොවන අය වෙනුවෙන් කරනු ලබන සේවාවන් සඳහා අරමුදල් රැස් කිරීමේද අරමුදල් එකතු කිරීමේ අරමුණු සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම.

- අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ රේඛීය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, වාර්ෂික පදනම මත පොල් සංවර්ධනයට අදාළ වැදගත් දත්ත සහ තොරතුරු එකතු කිරීම සහ බෙදා හැරීම.

- වැඩසටහන්, වාර්ෂික සැලසුම්, වාර්ෂික වාර්තා, සංවර්ධන ව්‍යාපෘති සහ ඉදිරිපත් කිරීම් වලට අදාල අනෙකුත් දත්ත සකස් කිරීම සහ අමාත්‍යාංශය විසින් අනුමත කිරීම.
- වාර්ෂිකව ශ්‍රී ලංකා එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලය සහ උපදේශක කණ්ඩායම් අතර රැස්වීම් සංවිධානය කිරීම, අරමුදල් සැපයීම සහ සංවිධානය කිරීම.
- රාජ්‍ය නොවන සංවිධාන හා පරිත්‍යාගශීලීන් සමඟ සම්බන්ධතා පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධනය උදෙසා අවශ්‍ය අරමුදල් සපයාගැනීම සහ පුහුණු සඳහා තාක්ෂණික හා මූල්‍යමය ආධාර ලබා ගැනීම
- පොල් අංශයේ නිෂ්පාදන හා අලෙවිකරණය වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් පොල් තවාන් වගා කරන්නන්, වතු හිමියන් සහ සංවර්ධකයින් සහ පොල් සකසනයන් සහ, අගය එකතු කරන්නන් සහ පොල් නිෂ්පාදන අපනයනකරුවන් අතර සංවර්ධන ජාල ඇති කිරීම
- පොල් සංවර්ධනය සඳහා තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබා ගැනීම පිණිස කලාපීය සහ ජාත්‍යන්තර පොල් සංවිධාන සමඟ සම්බන්ධතා පැවැත්වීම.
- පොල් සංවර්ධන කටයුතු සඳහා කලාපීය හා ජාත්‍යන්තර රැස්වීම්වලට සහභාගී වීමට නියෝජිතයින්ට පහසුකම් සැපයීම.
- බලධාරීන් විසින් කලින් කලට ඉල්ලා සිටිය හැකි වාර්තා නිසි වෙලාවට සකස් කර ඉදිර්පත් කිරීම.

## එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලයේ සංයුතිය

එකාබද්ධ පොල් කර්මාන්ත ආශ්‍රිත වාණිජ මණ්ඩලයේ ප්‍රධාන තනතුරු දෙකක් තිබේ.

1. මහලේකම්
2. කාර්යාල කළමනාකරු

**මහලේකම්**

නිළයේ අරමුණ

සුදුසු හා ඵලදායී තීරණ ගැනීම සඳහා ශ්‍රී ලංකා JCIC වෙත උපාය මාර්ග ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සහ වැඩසටහන් හරහා වාර්තා කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ තොරතුරු සැපයීම වැනි සම්බන්ධීකරණ කාර්යභාරයක් ඉටු කිරීම.

වාර්තා කිරීම

මහලේකම්වරයා, මාසිකව හෝ අවශ්‍ය අවස්ථාවලදී JCIC කාර්යාලයට සහ අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ඇත.

කාර්යයන්

1. උපායමාර්ග, මූල්‍ය හා කාර්යසාධන ඇතුළුව සියළුම ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා සැලසුම් අධීක්ෂණය හා වාර්තා කිරීම ස්ථාපනය කිරීම.
2. උපාය මාර්ග කොටස් යටතේ අභ්‍යන්තර වාර්තාකරණය සහ අනෙකුත් ප්‍රධාන තොරතුරු සුදානම් කිරීම.
3. JCIC කාර්යාලයට සතිපතා සංක්ෂිප්තව තොරතුරු ඉදිරිපත්කිරීම (සෑම විටම ලිඛිතව සහ අවශ්‍ය නම් වාචිකව)
4. කාර්යාල කළමනාකරු විසින් තබා ඇති රැස්වීම් සටහන්වල වලංගුභාවය සහතික කිරීම.
5. JCIC කාර්තුමය වාර්තා සකස් කිරීම සඳහා වලංගුභාවය සහතික කිරීම සහ අනුමත කිරීම.
6. කාර්යාල කළමනාකරුගේ වැඩකටයුතු අධීක්ෂණ හා සතිපතා කාර්ය සැලසුම් කිරීම.
7. උපදේශකයින්ගේ ලැයිස්තුව නඩත්තු කිරීම, සතුටුදායක ධාරිතා වර්ධන ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා සියලු තාක්ෂණික යෙදවුම් අධීක්ෂණය කිරීම.
8. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම දියත් කිරීමට සහාය වන ලියකියවිලි සකස් කිරීම.

**කාර්යාල කළමනාකරු**

නිළයේ අරමුණු

සමස්ත ලේකම් කාර්යාල සහාය ඇතුව ඵලදායි, කාර්යක්ෂම වෘත්තීය ලේකම් කාර්යාලයක් පවත්වාගෙන යාම.

වාර්තාකරණය

කාර්යාල කළමනාකරු විසින් සතිපතා මෙහෙයුම් වාර්තාවක් මහලේකම්වරයාට සකස් කරනු ඇත.

කාර්යයන්

1. ලේකම් කාර්යාලය කළමනාකරණය කිරීම ඇතුළුව විද්‍යුත් තැපෑල, දුරකථන සහ අමුත්තන් පිළිගැනීම හරහා දෛනික සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම.
2. රැස්වීම් සටහන් නඩත්තු කිරීම/ වාර්තාකරණය සහ JCIC න්‍යාය පත්‍ර බෙදා හැරීම.
3. විද්‍යුත් තැපෑල හෝ මුද්‍රණ මාධ්‍යයෙන් පාර්ශවකරුවන් වෙත විධිමත් තොරතුරු යාවත්කාලීන කිරීම් (පුවත් සගරා, යාවත්කාලීන කිරීම් ආදිය) නඩත්තු කිරීම.
4. ශ්‍රී ලංකා පොල් ලේකම් කාර්යාලයේ සහාය ඇතුව ක්‍රියාකාරකම් සම්බන්ධීකරණ කටයුතු, සංචාරයන්ද ඇතුළුව, දෛනික දීමනා, රැස්වීම් ආහාරපාන, ස්ථාන සහ වෙනත් ඒ හා සමාන කටයුතු සම්පාදනය කිරීම.

**තවාන්, ප්‍රාථමික නිෂ්පාදන සහ ඵලදායිතා උපදේශක කණ්ඩායමේ කාර්යභාරයන්**

අ) ලේඛනයේ යෝජනා කර ඇති උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා, උපාය මාර්ග සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම මෙන්ම උපදේශක කණ්ඩායම වෙත අනුයුක්ත කර ඇති උපායමාර්ග ඉටුකිරීම සඳහා ගෙන ඇති ක්‍රියාකාරකම් වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වගකීමෙන් බැඳී සිටී.

ආ) ඵලදායිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් මහලේකම් කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික හා උපදේශන සහාය ලබා දීම.

ඇ) පොල් තවාන් සංවර්ධන සැලසුම් සම්බන්ධයෙන් මහලේකම් කාර්යාලයට තාක්ෂණික හා උපදේශන සහාය ලබා දීම.

ඈ) ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි පොල් තවාන් ව්‍යාපාරික ආයත සහ පොල් වගා කරන්නන් සහ නිෂ්පාදකයින් සඳහා තාක්ෂණික සහ උපදේශන සේවා සැපයීම.

ඉ) පොල් නිෂ්පාදනය පිළිබඳ දත්ත සහ තොරතුරු රැස්කිරීම සම්බන්ධයෙන් මහලේකම් කාර්යාලයට අවශ්‍ය සහාය සහ තාක්ෂණික සහාය ලබා දීම.

ඊ) සැලසුම් සහ වාර්තාකරණ අරමුණු සඳහා අවම වශයෙන් වසරකට දෙවරක්වත් හමු වීම.

උ) පොල් කර්මාන්ත සංවර්ධන උපාය මාර්ග සැලසුමේ නිශ්චිතව දක්වා ඇති සැලසුම් කළ පොල් තවාන් වැඩසටහන්හි ඇතුලත් පොල් සිටුවීමේ වාර්ෂික ඉලක්කය කෙරෙහි අවධානය යොමු කිරීමට අදාළ කාර්තුමය වාර්තා මහලේකම් කාර්යාලයට ලබා දීම.

ඌ) කෘමි සහ රෝග වලින් පොල් වගාව ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ලේකම් කාර්යාලය හරහා අදාළ නිලධාරීන්ට උපදෙස් දීම.

එ) ලේකම් කාර්යාලයෙන් තම සාමාජිකයින් හට සැලසෙන ප්‍රයෝජනවත් භාවය ඉහල නැංවීම සඳහා පර්යේෂණ හා වාර්තා, මගින් නව සොයාගැනීම් මහලේකම් කාර්යාලය වෙත යොමු කිරීම.

**අගය එකතු කිරීමේ අලෙවිකරණ සහ වෙළඳ සන්නාම උපදේශන කණ්ඩායමේ කාර්ය**භාරයන්

අ) වෙළඳපොලේ සංසන්දනාත්මක වාසියක් ඇති පොල් නිෂ්පාදන වර්ග සම්බන්ධයෙන් මහලේකම් කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික හා උපදේශන සහාය ලබා දීම.

ආ) දේශීය හා අපනයන වෙළඳපොල ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීම සඳහා, විවිධ පොල් නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි මෙවලම් සහ යන්ත්‍ර පිළිබඳව මහලේකම් කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික හා උපදේශන සේවා සැපයීම.

ඇ) අනාගත සංවර්ධන හවුල්කරුවන් සමඟ තාක්ෂණය හා තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මහලේකම් කාර්යාලයට අවශ්‍ය උපදෙස් ලබා දීම.

ඈ) විවිධ පොල් නිෂ්පාදනයන් සම්බන්ධයෙන් මතුව ඇති වෙළඳපල අවස්ථා පිළිබඳව උපදෙස් මහලේකම් කාර්යාලය හරහා වගාකරුවන්ට ලබා දීම.

ඉ) ප්‍රවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා පොල් අංශය තුළ කුමන ආකාරයේ ආයෝජන අවස්ථා තිබේද යන්න පිළිබඳව උපදෙස් ලබා දීම.

(ඊ) පාර්ශවකරුවන්ට, යාවත්කාලීන සහ ඵලදායී අලෙවිකරණ ක්‍රම සහ වෙළඳ සන්නාම මෙවලම් සහ ක්‍රමෝපායන් පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දීම.

උ) වෙළඳපල තොරතුරු සහ දත්ත රැස් කිරීම සම්බන්ධයෙන් මහලේකම් කාර්යාලයට තාක්ෂණික සහාය ලබා දීම.

ඌ) සැලසුම් සහ වාර්තා කිරීම සඳහා අවම වශයෙන් වසරකට දෙවතාවක්වත් හමු වීම.

**පළාත් පොල් සංවර්ධන සංගම්වල කාර්යභාරයන්**

අ) ශ්‍රී ලංකා පොල් ලේකම් කාර්යාලය වෙනුවෙන් පළාතේ පොල් සංවර්ධන සංගම්වල සාමාජිකයින් සමඟ සම්බන්ධතා පැවැත්වීම මගින් ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළ කරුණු ලබා දීම.
ආ) ශ්‍රී ලංකා පොල් ලේකම් කාර්යාලයේ සාමාජිකයින්ගේ අවශ්‍යතා කාලෝචිතව ඉටුකරදීමට වගකීම භාර ගැනීම.
ඇ) පළාතේ සියලුම පාර්ශවකරුවන්, එම පළාත් සංගම්වල සාමාජිකත්වය ලබාගැනීමට දිරිමත් කිරීම.
ඈ) පළාත් මට්ටමේ පොල් සංවර්ධන සංගම්වලට අයත් අරමුදල් කළමනාකරණය කිරීම.
ඉ) පළාත්වල පොල් සංවර්ධනයට අදාළ දත්ත හා තොරතුරු නිතිපතා රැස් කිරීම හා සම්පාදනය කිරීම.
ඊ) කලාපීය වගාකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ සහ වෙළෙඳ සංගම්වල වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා පහසුකම් සැපයීම.
උ) මෙම අංශයේ වර්ධනය සම්බන්ධයෙන් පොල් ලේකම් කාර්යාලය සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම.
ඌ) ශ්‍රී ලංකා පොල් ලේකම් කාර්යාලයේ සාමාජිකයන්ගෙන් සහ ලේකම් කාර්යාලයෙන් සාමාජික ගාස්තු එකතු කිරීමට සහ ආරක්ෂිතව තබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.
එ) වාර්ෂිකව පොල් නැවත සිටුවීම හා වාර්තා තබා ගැනීම සඳහා මහලේකම් කාර්යාලය සමඟ සම්බන්ධතා පැවැත්වීම.
ඒ) ලේකම් කාර්යාලය විසින් වරින් වර නියම කරනු ලබන වෙනත් ඕනෑම වගකීමක් ඉටු කිරීම
ඔ) සැලසුම් කිරීම සහ වාර්තා කිරීම සඳහා අවම වශයෙන් කාර්තුවකට වරක්වත් හමුවීම.

# 9. පොල් සංවර්ධන උපාය මාර්ගයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බලපාන සාධක

මෙම පොල් සංවර්ධන උපාය මාර්ගයේ සාර්ථකත්වය රඳා පවතින්නේ එය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, නිරන්තර අධීක්ෂණයට පාත්‍ර කිරීම සහ වරින් වර ඇගයීම මතය.

උපාය මාර්ගයන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වන සාධක කිහිපයක් පහත දැක්වේ.

1. ඒකාබද්ධ පොල් කර්මාන්ත වාණිජ මණ්ඩලය පිහිටුවීම, මහලේකම් කාර්යාලයට අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීම සහ ලේකම් කාර්යාල නිලධාරීන් බඳවා ගැනීම.

2. සාර්ථකව සැලසුම් ක්‍රියාත්මක කිරීම මෙන්ම නිසි ලෙස ප්‍රගති අධීක්ෂණය සහතික කිරීම සඳහා ඒකාබද්ධ පොල් කර්මාන්ත වාණිජ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් හා ධාරිතා වර්ධන කිරීමේ අභ්‍යාස පැවැත්විය යුතුය. සාම්ප්‍රදායික නොවන ගැටළු පිළිබඳ විශේෂ පුහුණුවක් / කෘෂිකාර්මික සංවර්ධනයේ ඉල්ලුමක් සංවිධානය කළ යුතුය.

3. පොල් කර්මාන්ත සංවර්ධය කිරිමේ ක්‍රමෝපායයන්ගේ ඵලදායිතාවය සහ ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් ක්‍ෂණික හරහා සිදු කළ යුතුය. මීට අමතරව, උපාය මාර්ග කාර්ය සාධන දර්ශකයන් සංශෝධනය කිරීම හා ශක්තිමත් කිරීම වහා සිදු කල යුතුය.

4. ව්‍යවස්ථාදායකයේ මැදිහත්වීම හරහා පළාත් පොල් සංවර්ධන සංගම් ශක්තිමත් කළ යුතු අතර මෙම උපාය මාර්ගයේ අන්තර්ගතය පිළිබඳව අඛණ්ඩව මහජනතාව වරින් වර දැනුවත් කිරීම.

5. සමාජයේ සෑම තරාතිරමකම සිටින පොල් අංශයේ පාර්ශවකරුවන් අතර සන්නිවේදන හා දැනුවත්භාවය ගොඩනැගිය යුතුය. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ ප්‍රතිපෝෂණ දත්ත විධිමත් හා අවිධිමත් ලෙස ග්‍රහණය කර ගැනීම සඳහා යාන්ත්‍රණ ගොඩ නගා නඩත්තු කළ යුතුය.

6. පොල් ක්‍රමෝපාය පිළිබඳ මධ්‍ය කාලීන සමාලෝචනයක් සිදු කළ යුතුය. උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට බලපෑ හැකි ඕනෑම අනපේක්ෂිත සිදුවීම් සඳහා අනාගත පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගැනීම වෙනුවෙන් මෙම සමාලෝචන වාර්තා උපයෝගී කරගැනීමට හැකි වනු ඇත.

මෙම පොල් ක්‍රමෝපායේ ප්‍රතිඵල පිළිබඳ අවසාන ඇගයීම 2024 වර්ෂ අවසානයේ සිදු කිරීමට නියමිතය. එබැවින් පූර්ව වර්ෂ පහ සඳහා සමාලෝචනයක් සැලසුම් කළ යුතු වේ.

# 10. නිගමනය

පොල් කර්මාන්තයේ දියුණුව සඳහා උපාය මාර්ගික සැලැස්මක් නිර්මාණය කිරීමෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් සඳහා දැක්ම පෙන්වා ඇත. ඉදිරි ගමනේ ප්‍රධාන අභියෝගයන් වනුයේ ආරම්භයේ මෙන්ම අඛණ්ඩව ගම්‍යතාවය අනාගතයටත් පවත්වා ගෙන යාම සහ මෙම උපායමාර්ගය යටතේ අංශ අඛණ්ඩව වැඩිදියුණු කිරීමයි. මෙහෙයුම් සහ උපායමාර්ගික සැලසුම් ලේඛන, ආයතනික මෙහෙයුම සහ දැක්මට අදාළ ප්‍රකාශන අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම මෙම උපායමාර්ගික සැලසුම්හි සාර්ථකත්වයට වැදගත් අංගයකි. ප්‍රතිපත්ති සම්පාදකයින්, නායකයින්, කළමනාකරණය සහ සැලසුම්කරුවන් විසින් පාර්ශවකරුවගේ අවශ්‍යතා සපුරාලන බවට සහතික වීම සඳහා එකිනෙකා සමඟ දැනටමත් ආරම්භ කරන ලද සංවාදයන් ඉදිරියටම පවත්වා ගත යුතුය.

මීට අමතරව, මෙම මූලික සැලසුමට ප්‍රතිචාර වශයෙන් නව වැඩසටහන් ක්‍රියාත්මක කරනා බැවින් අනාගතයේ ක්ෂේත්‍රයට අදාළ වන නව දුර්වලතා සහ තර්ජන හට ගැනෙනු ඇත. වර්තමාන කැලඹිලි සහිත පරිසරයක, එනම් වේගයෙන් වෙනස් වන පරිසරයක් තුළ මෙය ප්‍රත්‍යක්ෂ යථාර්තයක් වේ.

මෙම සැලැස්මේ ඉලක්කය වුයේ, ජාතික මට්ටමේ ප්‍රායෝගික අවශ්‍යතා සපුරාලන සහ දිවයින පුරා ප්‍රතිපත්ති සහ සැලසුම් අවශ්‍යතා ඉටු කරන පුළුල් මට්ටමක සැලැස්මක් ගොඩ නැගීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, උපායමාර්ගික අරමුණු 83ක් සහිත ලැයිස්තුවක් මෙම ලේඛනයේ යෝජනා කර තිබේ. අද දක්වා ප්‍රදර්ශනය කර ඇති නායකත්ව කැපවීම තවදුරටත් පවත්වා ගැනීමත් සහ කළමනාකරුවන්ට සහ කාර්ය මණ්ඩලයට නිසි සහයත්, මගපෙන්වීමත් අඛණ්ඩව ලබාදීමත් මෙම සැලැස්ම ඵලදායී මට්ටමක් කරා රැගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ලෙස සැලකේ.

මෙම සැලැස්ම දිගුකාලීන ක්‍රියාවලියක පළමු පියවර ලෙස සැලකිය යුතුය. විධිමත් යාන්ත්‍රණයක් තුළින් සැලසුම් වරින් වර සහ ක්‍රමානුකූලව සමාලෝචනය කිරීම, පාර්ශවකරුවන්ගේ ආකල්පයන් එකතු කර ගන්නා වැඩසටහන් පවත්වාගෙනයාම හා ක්ෂේත්‍රයේ වැඩසටහන් නිසි ලෙස ක්‍රියාවට යෙදීම් උදෙසා වගකීම් දරන කළමනාකාරිත්වයක් සහතික කිරීම අත්‍යාවශ්‍ය වේ. එබඳු අඛණ්ඩ කැපවීමක් තුළින් කර්මාන්තයේ සාර්ථක ඉදිරිගමනට අවශ්‍ය ජවය සැපයෙනු ඇත.